# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report 2012

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
## பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சு
## Ministry of Plantation Industries


55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

இலக்கம் 55/75, வொக்ஷோல் ஒழுங்கை, கொழும்பு 02.

**No. 55/75, Vauxhall Lane, Colombo 02.**

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව

# 2012

## වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

55/75, වොක්ෂෝල් පටුමග, කොළඹ 02.

# පටුන


| | පිටුව |
|---|---|
| 1. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | |
| 1.1 හැඳින්වීම | 1 |
| 1.2 දැක්ම | 1 |
| 1.3 මෙහෙවර | 1 |
| 1.4 අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති | 2 |
| 1.5 අමාත්‍යාංශයේ උපායමාර්ගික සංවර්ධන අරමුණු | 2 |
| 1.6 අමාත්‍යාශයේ කාර්ය සාධන දර්ශක | 2 |
| 1.7 2012 වර්ෂය තුළ ඉටුකරන ලද සංවර්ධන කාර්යයන් | 3 |
| 2. මූල්‍යමය ප්‍රගති සමාලෝචනය | 6 |
| 3. ආංශික සමාලෝචනය | |
| 3.1 තේ ක්ෂේත්‍රය | 7 |
| 3.2 රබර් ක්ෂේත්‍රය | 14 |
| 3.3 කටුපොල් ක්ෂේත්‍රය | 20 |
| 3.4 විදේශ ණය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති | |
| 3.4.1 කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 21 |
| 4. ආංශීය කාර්ය සාධනය | |
| 4.1 පාලන අංශය | 26 |
| 4.2 ගිණුම් අංශය | 28 |
| 4.3 අභ්‍යන්තර විගණන අංශය | 29 |
| 4.4 සංවර්ධන අංශය | 31 |
| 4.5 සැලසුම් අංශය | 33 |
| 4.6 වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය | 35 |
| 4.7 තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන ) මණ්ඩලය | 39 |
| ඇමුණුම I 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය | 41 |

# 01 වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

## 1.1 හැඳින්වීම

1971 වසර තුළදී ශ්‍රී ලංකාවේ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය ස්ථාපිත කරන ලද්දේ තේ, රබර්, පොල්, තල්, උක්, මල්බෙරි සහ කජු ආදී වගාවන් ඇතුළත් වැවිලි බෝග සංවර්ධනය අරමුණු කොටගෙනය. 2010.11.22 දිනැති අංක 1681/3 දරණ ගැසට් පත්‍රය මගින් සිදුකරන ලද සංශෝධනය අනුව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත දැනට පැවරී ඇති කාර්යයන් වන්නේ, මහින්ද චින්තන ඉදිරි දැක්ම හා රජය මගින් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ජාතික ප්‍රතිපත්තීන් මත පිහිටා අමාත්‍යාංශයට හා ඊට අයත් ව්‍යවස්ථාපිත ආයතනයන්හි තේ හා රබර් යන විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් හා ව්‍යාපෘති සම්පාදනය, ක්‍රියාත්මක කිරීම හා මෙහෙයවීම, තේ හා රබර් කර්මාන්ත සංවර්ධනය සහ පර්යේෂණයන්ට අදාළ කටයුතු, තේ, රබර් හා පොල් වතු කැබලි කිරීම පාලනය කිරීම හා ඒ සම්බන්ධව බලපත්‍ර නිකුත් කිරීමට අදාළ කටයුතු යනාදිය වේ. වෙනත් අමාත්‍යාංශයක් යටතට නිශ්චිතව පවරා නොමැති වැවිලි භෝගයන් ප්‍රවර්ධනය හා පර්යේෂණ කටයුතු ද මෙම අමාත්‍යාංශයට අයත් වන බැවින් කටුපොල් වගාව සම්බන්ධ කටයුතු ද පැවරී ඇත.

මෙම කාර්යයන් ඉටු කිරීම සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල, සීමාසහිත කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, රබර් පර්යේෂණ ආයතනය, තුරුසවිය අරමුදල, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, තේ, රබර් හා පොල් වතු (කැබලි කිරීමේ පාලනය) මණ්ඩලය යන ආයතනයන් මෙම අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. මීට අමතරව, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් ශ්‍රී ලංකා රජයේ උපදේශකත්වය යටතේ මෙහෙයවනු ලබන ''කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන'' ද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 දැක්ම

''වැවිලි කර්මාන්තයේ සංවර්ධනය මගින් ජාතික සෞභාග්‍යය උදා කිරීම".

## 1.3 මෙහෙවර

ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් තහවුරු වූ වැවිලි අංශයක් මගින් වැවිලි කර්මාන්තයේ ඵලදායිතාවය, ලාභදායිතාවය සහ තිරසාරත්වය ඉහළ නැංවීම.

## 1.4 අමාත්‍යාංශයේ ප්‍රතිපත්ති

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව 2010 වර්ෂයේදී මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද ශ්‍රී ලංකා රජයේ ප්‍රතිපත්ති රාමුවට අනුකූලව අමාත්‍යාංශය විසින් ක්‍රියාවට නංවනු ලබන ප්‍රතිපත්ති පහත පරිදි වේ.

I. වැවිලි වගාබිම්වල ඵලදායිතාව ඉහළ නැංවීම.
II. තේ සහ රබර් නැවත වගා කිරීමේ වාර්ෂික අනුපාතය ඉහළ නැංවීම.
III. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට වගාව ව්‍යාප්ත කිරීම.
IV. පර්යේෂණ සහ සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
V. අගය එකතු කිරීම සහ වෙළෙඳ නාම ප්‍රවර්ධනය.
VI. අතුරු බෝග වගාව ව්‍යාප්ත කිරීම.

## 1.5 අමාත්‍යාංශයේ උපාය මාර්ගික සංවර්ධන අරමුණු

I. විදේශ විනිමය ඉපැයීම ඉහළ නැංවීම.
II. නිෂ්පාදන පිරිවැය අවම මට්ටමක පවත්වා ගැනීම.
III. කුඩා වතු හිමියන්ගේ සහ වැවිලි සමාගම්වල ලාභදායකත්වය ඉහළ නැංවීම
IV. වැවිලි ප්‍රජාවගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීම.
V. දේශීය පාරිභෝගිකයන්ට තත්ත්වයෙන් උසස් ගුණාත්මක නිෂ්පාදන ලබාදීම.
VI. පරිසර සංරක්ෂණය තුළින් තිරසාර සංවර්ධනය
VII. තේ සහ රබර් නිෂ්පාදන සඳහා ජාත්‍යන්තර වෙළෙඳපොළ ප්‍රසාරණය කිරීම

## 1.6 අමාත්‍යාංශයේ කාර්ය සාධන දර්ශක

අමාත්‍යාංශයේ මධ්‍යකාලීන සංවර්ධන අරමුණු සාක්ෂාත් කර ගැනීමේ අරමුණින් කාර්ය සාධන දර්ශක 6 ක් හඳුනාගෙන ඇත.

I. තේ සහ රබර් වලින් උපයන විදේශ විනිමය ප්‍රමාණය.
II. ඵලදායිතාව (බිම් ඒකකයකින් ලබන අස්වැන්න වැඩිවීම)
III. තේ සහ රබර් ඉඩම්වල නැවත වගා කිරීමේ අනුපාතය.
IV. නව වගා බිම් ප්‍රමාණය.
V. අගය එකතු කළ නිෂ්පාදන ප්‍රමාණය හා වටිනාකම.
VI. විකුණුම් මිලට සාපේක්ෂව අඩු නිෂ්පාදන පිරිවැය.

## 1.7 2012 වර්ෂය තුළ ඉටුකරන ලද සංවර්ධන කාර්යයන්

I. තේ සහ රබර් ක්ෂේත්‍රයේ වගාකරුවන්, නිෂ්පාදකයින්, අපනයනකරුවන් සහ සමිති සංවිධානවල දායකත්වය ඇගයීම හා ඔවුන් තවදුරටත් අභිප්‍රේරණය කිරීම සඳහා සකස් කරනු ලැබූ විශේෂ තරගාවලිය යටතේ අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉතිහාසයේ ප්‍රථමවරට ජාතික වැවිලි සම්මාන උළෙලක් පැවැත්වීම.

II. කුඩා වතු හිමියන් හා ප්‍රාදේශීය වැවිලි සමාගම්වල හිමිකරුවන් හා සේවකයින් මෙන්ම වැවිලි ක්ෂේත්‍රයට සම්බන්ධ පිරිස් දැනුවත් කිරීම අරමුණු කර ගනිමින් ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය, රබර් පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව යන ආයතන යටතේ විවිධ පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

III. වැවිලි ක්ෂේත්‍රය පිළිබඳව සැකසුණු පුහුණු පත්‍රිකා වාර ප්‍රකාශන හා පර්යේෂණ කෘති එළිදැක්වීම ද සිදු විය.

IV. ආහාර අයිතමයක් ලෙස සැලකෙන තේ නිෂ්පාදනය, අලෙවිය හා පරිභෝජනයට අදාළව සාමාජික රටවල පවතින ගැටළු සාකච්ඡා කිරීම අරමුණු කර ගනිමින් ආහාර හා කෘෂිකර්ම සංවිධානය/ තේ පිළිබඳ අන්තර් රාජ්‍ය කණ්ඩායමේ රැස්වීම කොළඹ දී සාර්ථක අයුරින් පැවැත්වීම. ඊට අමතරව, තේ නිෂ්පාදනය කරන රටවල අමාත්‍යවරුන්ගේ සමුළුව 2013 වර්ෂය ආරම්භයේදී කොළඹදී පැවැත්වීමට අවශ්‍ය මූලික කටයුතු සංවිධානය කිරීම.

V. තේ හා රබර් පර්යේෂණ ආයතනයන් විසින් සිදු කරනු ලබන ගුණාත්මයෙන් උසස් විශේෂ ප්‍රභේද පිළිබඳව හා පස හා වගාව ආශ්‍රිතව අනෙකුත් පර්යේෂණ අඛණ්ඩව සිදු කිරීම.

VI. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව සමග එක්ව භූගෝලීය තොරතුරු පද්ධතිය උපයෝගීකර ගනිමින් තේ, රබර් හා කටුපොල් වගා ඉඩම් පිළිබඳ සිතියම් යාවත්කාලීන කිරීම සඳහා මූලික කටයුතු ආරම්භ කිරීම.

VII. ප්‍රාදේශීය වැවිලි සමාගම්වලට බදු දී ඇති ඉඩම්වල කැඩැස්තර මිනුම් කටයුතු නැවත ආරම්භ කිරීමට අවශ්‍ය මූලික කටයුතු කිරීම සහ ඒවා ආරම්භ කිරීම.

VIII. මුදල් කොමිෂන් සභාව සමග සම්බන්ධීකරණය කරමින් වැවිලි කර්මාන්ත ආශ්‍රිත තෝරාගත් ග්‍රාමීය ප්‍රවේශ මාර්ග අළුත්වැඩියා කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම.

IX. ඉලක්ක ගත සංවර්ධන කාර්යයන් සපුරා ගැනීම පහසු කිරීම සඳහා අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට අදාළ පනත් වර්තමාන හා අනාගත අවශ්‍යතාවලට සුදුසු පරිදි සංශෝධනය කිරීමට අවශ්‍ය කටයුතු කිරීම.

X. වැවිලි සමාගම් සතු වගා නොකළ ඉඩම් පිළිබඳව සිදු කරන ලද මූලික සංගණනය අනුව නව වගාව සඳහා සුදුසු ඉඩම් හඳුනා ගැනීමට කටයුතු කිරීම.

ඉහත හඳුනාගත් ඉඩම් බෙදා දීම සඳහා ජනාධිපති ලේකම්ගේ උපදෙස් අනුව, අදාළ අමාත්‍යාංශවල ලේකම්වරුන්, එක් එක් වගා දිස්ත්‍රික්කවල දිස්ත්‍රික් ලේකම්වරුන් හා අදාළ අනෙකුත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු නිලධාරීන්ගෙන් සමන්විත කමිටුවක් මගින් ඉඩම් බෙදා දීමේ යාන්ත්‍රණයක් පිළියෙල කිරීම හා එම වාර්තාව ජනාධිපති ලේකම් හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් වෙත ඉදිරිපත් කිරීම.

XI. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගා කටයුතු ව්‍යාප්ත කිරීම යටතේ උතුරු හා නැගෙනහිර පළාත්වල රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා පර්යේෂණ කටයුතු අඛණ්ඩව සිදුකිරීම, ඒ යටතේ වගාවට සුදුසු ප්‍රදේශ හඳුනා ගැනීම. ඒ අනුව, මුලතිව් හා වව්නියා දිස්ත්‍රික්කයන්හි ද වගාව ව්‍යාප්ත කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

XII. 2012 අයවැය යෝජනාවලට අනුකූලව අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක රබර් වගා සැලැස්ම සාර්ථක කරගැනීම සඳහා පදියතලාව, මහඔය, ලාහුගල හා උහන ප්‍රාදේශීය ලේකම්වරුන්, මහවැලි සංවර්ධන අධිකාරියේත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේත් ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුවේත්, වනජීවී දෙපාර්තමේන්තුවේත් නිලධාරීන්, අදාළ ග්‍රාම නිලධාරීන් සහ අම්පාර දිසාපති ඇතුළු අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් සම්බන්ධීකරණය කරගනිමින් අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම. එසේම, 2012 වර්ෂය තුළ හෙක්ටයාර 500 ක රබර් වගාව එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල ආරම්භ කිරීමට ක්‍රියා කිරීම.

XIII. පදියතලාව ප්‍රදේශයේ නව රබර් පැළ තවානක් ආරම්භ කිරීම සඳහා ඉඩම් පවරා ගැනීම සහ මූලික කටයුතු ආරම්භ කිරීම.

XIV. ලංකා බැංකුව සමග එක්ව කුඩා රබර් වතු හිමියන් සඳහා සහනදායි ණය යෝජනා ක්‍රමයක් හදුන්වාදීම.

XV. තාවකාලික වශයෙන් වසා තිබූ තේ කර්මාන්තශාලාවල නිෂ්පාදන කටයුතු නැවත ආරම්භ කිරීම.

- තේ ශක්ති අරමුදල යටතේ පාඩු ලැබ තාවකාලිකව වසා තිබූ හිනිදූම තේ කර්මාන්තශාලාව, කළුබෝව්ටියාන තේ කර්මාන්තශාලා සමාගම යටතට පත්කර ලාභදායී ලෙස නිෂ්පාදන කටයුතු පවත්වා ගෙන යාම.
- පාඩු ලැබ තාවකාලිකව වසා තිබූ ගිලීමලේ තේ ශක්ති කර්මාන්තශාලාවේ නිෂ්පාදන කටයුතු හිඳුරංගල කුඩා තේ වතු සංවර්ධන සමිතිය මගින් නැවත ආරම්භ කිරීම.
- තේ ශක්ති අරමුදල යටතේ ඉදිකිරීම් අරඹා තාවකාලිකව එම කටයුතු නවතා තිබූ දැරණියගල තේ කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු අවසන් කර, තේ නිෂ්පාදනය ආරම්භ කිරීම.
- තාවකාලිකව වැඩ නවත්වා තිබූ යටිනුවර නව තේ කර්මාන්තශාලාවේ ඉදිකිරීම් කටයුතු නැවත ඇරඹීම.

# 2. මූල්‍යමය ප්‍රගති සමාලෝචනය

රුපියල් මිලියන

| ආයතනය | 2012 වසර සඳහා ප්‍රතිශෝධිත ප්‍රාග්ධන ප්‍රතිපාදන | 2012 වසර සඳහා ප්‍රතිශෝධිත පුනරාවර්තන ප්‍රතිපාදන | 2012 දෙසැම්බර් 31 දක්වා ප්‍රාග්ධන වියදම | 2012 දෙසැම්බර් 31 දක්වා පුනරාවර්තන වියදම | ප්‍රාග්ධන කාර්ය සාධනය % | පුනරාවර්තන කාර්ය සාධනය % |
|---|---|---|---|---|---|---|
| අමාත්‍යාංශය | 41.952 | 139.080 | 23.989 | 132.675 | 57 | 95 |
| ශ්‍රී ලංකා තේ මණ්ඩලය | 63.560 | 117.600 | 21.000 | 117.110 | 33 | 100 |
| තේ පර්යේෂණ ආයතනය | 118.440 | 245.000 | 50.126 | 233.060 | 42 | 95 |
| කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය | 221.373 | 224.178 | 199.000 | 219.832 | 90 | 98 |
| රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව | 109.473 | 931.530 | 52.085 | 579.915 | 48 | *62 |
| රබර් පර්යේෂණ ආයතනය | 54.600 | 196.000 | 46.000 | 185.705 | 84 | 95 |
| තුරුසවිය අරමුදල | 5.187 | 9.792 | 5.187 | 9.792 | 100 | 100 |
| ජාතික වැවිලි කළමනාකරණ ආයතනය | 13.650 | 9.800 | 7.000 | 8.480 | 51 | 87 |
| කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන | 523.000 | - | 371.905 | - | 71 | - |
| **මුළු එකතුව** | **1151.235** | **1872. 980** | **776.292** | **1486.569** | **67** | **79** |

*රබර් වගා සහනාධාරය සඳහා ගෙවිය යුතු මුදල් නොලැබීම පුනරාවර්තන කාර්ය සාධනය අඩුවීමට හේතු වී ඇත.

# 3. ආංශික සමාලෝචනය

## 3.1 තේ ක්ෂේත්‍රය

වර්ෂ 1867 දී ජේම්ස් ටේලර් ( James Taylor ) විසින් මෙරටට හඳුන්වා දෙන ලද තේ වගාව මේවන විට ශ්‍රී ලංකාවේ උඩ රට, මැද රට සහ පහත රට තෙත් කලාපීය දිස්ත්‍රික්ක 14 ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 ක් තුළ ව්‍යාප්ත වී ඇත. තේ කර්මාන්තයට අදාළ ඉදිරි දැක්ම වනුයේ, තිරසාර සංවර්ධනයක් උදෙසා කුඩා වතු අංශය සහ සංස්ථායික අංශය ශක්තිමත් කිරීම තුළින් තේ කර්මාන්තයේ අනාගතය සුරක්ෂිත කිරීම සහ ජාත්‍යන්තර පානීය වෙළෙඳපොළෙහි ප්‍රමුඛයා බවට ශ්‍රී ලංකාව පත්කර ගැනීමයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින ශ්‍රී ලංකා තේ මණ්ඩලය, තේ පර්යේෂණ ආයතනය, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල සහ සීමාසහිත කළුබෝවිටියාන තේ කම්හල් සමාගම යන ආයතන තේ ක්ෂේත්‍රයට අදාළව ක්‍රියාත්මක වන රාජ්‍ය ආයතන වේ.


2012 වර්ෂයේදී හෙක්ටයාර 203,020 ක භූමි ප්‍රමාණයක තේ වගාව ව්‍යාප්තව පැවති අතර, එයින් හෙක්ටයාර 120,955 (සියයට 59 ) ක් කුඩා තේ වතු අංශයට අයත් විය. තව ද හෙක්ටයාර 72,684 (සියයට 36 ) ක වගා බිම් ප්‍රමාණයක් ප්‍රාදේශීය වැවිලි සමාගම් සතු වූ අතර, හෙක්ටයාර 9,381 (සියයට 5) ක් රාජ්‍ය ආයතන යටතේ පැවතිණ.

සමාලෝචිත වර්ෂය තුළ තේ හෙක්ටයාරයක සාමාන්‍ය අස්වැන්න කිලෝග්‍රෑම් 1,688 ක් වූ අතර, 2011 වර්ෂයේදී එය කිලෝග්‍රෑම් 1,662 ක් විය. එනම් 2011 වර්ෂය හා සැසැඳීමේදී සියයට 1.6 ක වැඩිවීමකි. 2012 වර්ෂයේදී තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 328.4 ක් වූ අතර, 2011 වර්ෂයේදී එය කිලෝග්‍රෑම් මිලියන 327.5 ක් විය. එනම්, 2011 වර්ෂයේ තේ නිෂ්පාදනයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සියයට 0.3 ක සුළු වර්ධනයක් සිදුව ඇත. 2012 වර්ෂයේ මුල්භාගයේදී විශේෂයෙන්ම මධ්‍යම හා ඌව පළාත්වල පැවති දැඩි නියඟය සහ වර්ෂය අග භාගයේදී පැවති ශීත කාලගුණික තත්ත්වය තේ නිෂ්පාදනය මෙවැනි සුළු වර්ධනයකට සීමා කිරීමට හේතු විය.

සමාලෝචිත වර්ෂයේදී උන්නතාංශ අනුව තේ නිෂ්පාදනය සැලකීමේදී, පහත රට තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 202.1 ක් වූ අතර, එම ප්‍රමාණය වසරේ මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 62 කි. උඩ රට හා මැද රට තේ නිෂ්පාදනය පිළිවෙලින් කිලෝ ග්‍රෑම් මිලියන 73.7 ක් හා කිලෝග්‍රෑම් මිලියන 52.6 ක් ලෙස වාර්තා වූ අතර, එය මුළු තේ නිෂ්පාදනයෙන් පිළිවෙළින් සියයට 22 ක් සහ සියයට 16 ක් විය. 2011 හා 2012 වර්ෂයන්හි උන්නතාංශ අනුව සමස්ත තේ නිෂ්පාදනය 3.1 රූප සටහනෙන් දැක්වේ.

**3.1 රූප සටහන**

**2011 හා 2012 වර්ෂයන්හි උන්නතාංශ අනුව තේ නිෂ්පාදනය**




ඒ අනුව, 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී උඩරට තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 4.5 කින් අඩු වී ඇති අතර, එම අඩුවීමට මූලික හේතුව වූයේ මීට පෙර ද සඳහන් කර ඇති පරිදි, උඩරට තේ වගාකරනු ලබන ප්‍රදේශයන්හි පැවති අහිතකර කාලගුණික තත්ත්වයයි. නමුත්, 2011 වර්ෂයේදී කිලෝග්‍රෑම් මිලියන 196.7 ක් වූ පහතරට තේ නිෂ්පාදනය 2012 වර්ෂයේදී කිලෝග්‍රෑම් මිලියන 202.1 ක් දක්වා කිලෝග්‍රෑම් මිලියන 5.4 (සියයට 2.8 ) කින් වර්ධනය වී ඇත.

තවද, 2011 හා 2012 වර්ෂයන්හි මුළු තේ නිෂ්පාදනය ප්‍රධාන තේ නිෂ්පාදන ක්‍රමවේදයන් අනුව පහත වගුවෙහි දක්වා ඇත.

**3.1 වගුව**

**2011 හා 2012 වර්ෂයන්හි නිෂ්පාදන ක්‍රමවේදයන් අනුව තේ නිෂ්පාදනය**

| වර්ගීකරණය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | කි.ග්‍රෑ.මි | මුළු නිෂ්පාදනයේ % | කි.ග්‍රෑ.මි | මුළු නිෂ්පාදනයේ % |
| සාම්ප්‍රදායික කළු තේ | 302.0 | 92 | 302.1 | 92 |
| සී.ටී.සී තේ | 22.5 | 7 | 23.3 | 7 |
| හරිත තේ | 3.0 | 1 | 3.0 | 1 |
| **මුළු එකතුව** | **327.5** | **100** | **328.4** | **100** |

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සී.ටී.සී. තේ නිෂ්පාදනය කිලෝග්‍රෑම් මිලියන 0.7 කින් එනම්, සියයට 3 කින් වර්ධනය වී ඇත. එහෙත්, 2011 වර්ෂයට සාපේක්ෂව

2012 වර්ෂයේදී මුළු තේ නිෂ්පාදනය සඳහා එක් එක් වර්ගයන්හි සාපේක්ෂ දායකත්වයෙහි කැපීපෙනෙන වෙනසක් සිදු වී නොමැත.

2011 වර්ෂයේදී කුඩා තේ වතු අංශයේ නැවත වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 772 ක් වුවද, 2012 වර්ෂයේදී එය හෙක්ටයාර 937ක් දක්වා වර්ධනය වී ඇත. මෙයින් හෙක්ටයාර 889 ක් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය යටතේ ද හෙක්ටයාර 48 ක් කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන යටතේ ද වගා කෙරිණ. තවද, සමාලෝචිත වර්ෂයේදී කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් කුඩා තේ වතු අංශයේ හෙක්ටයාර 239 ක් තුළ තේ නව වගාව සිදුකර ඇත. 2011 වර්ෂයේදී කිලෝග්‍රෑම් මිලියන 229 ක් එනම්, මුළු තේ නිෂ්පාදනයෙන් සියයට 70 ක් වූ කුඩා තේ වතු හිමියන්ගේ දායකත්වය සමාලෝචිත වර්ෂයේදී කිලෝග්‍රෑම් මිලියන 234.2 ක්, එනම් සියයට 71 ක් දක්වා වර්ධනය වී ඇත. 2011 හා 2012 වර්ෂයන්හි ආංශික තේ නිෂ්පාදනය පහත වගුවෙන් දැක්වේ.

**3.2 වගුව**

**2011 හා 2012 වර්ෂයන්හි ආංශික තේ නිෂ්පාදනය**

**කිලෝග්‍රෑම් මිලියන**

| අංශය | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| සංස්ථායික අංශය | | **98.5** | | **94. 2** |
| -ප්‍රාදේශීය වැවිලි සමාගම් | 94.2 | | 90. 2 | |
| -ජනවසම, රා.වැ.ස. හා ඇල්කඩුව හා වෙනත් | 4.3 | | 4. 0 | |
| කුඩා තේවතු අංශය | | 229.0 | | 234 .2 |
| **එකතුව** | | **327.5** | | **328.4** |

2011 වර්ෂයේදී කුඩා තේ වතු හිමියන් විසින් නිෂ්පාදනය කරන ලද මුළු තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 229 ක් වුවද, 2012 වර්ෂයේදී එය කිලෝග්‍රෑම් මිලියන 234.2 ක් දක්වා එනම්, කිලෝග්‍රෑම් මිලියන 5.2 (සියයට 2.27) කින් වර්ධනය වී ඇත. සමාලෝචිත වර්ෂය තුළදී ද කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මගින් කුඩා තේ වතු හිමියන් උදෙසා අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලද තේ නව වගා සහ නැවත වගා වැඩසටහන්, පාළු සිටුවීමේ වැඩසටහන්, ව්‍යාප්ති හා උපදේශන සේවා සහ පුහුණු වැඩසටහන් හේතුවෙන් කුඩා තේ වතු අංශයේ සාපේක්ෂ දායකත්වයේ ඉහළයාමක් සිදු වී ඇත. ජාතික පොහොර සහනාධාර වැඩසටහන යටතේ තේ වගාව උදෙසා අඛණ්ඩව ලබාදුන් පොහොර සහනාධාරයද කුඩා තේ වතු අංශයේ සාපේක්ෂ දායකත්වය වැඩි වීමට හේතු වූ අතර, 2012 වර්ෂය වන විට තේ නැවත වගාව හා නව වගාව සඳහා පිළිවෙලින්

හෙක්ටයාරයකට රුපියල් 300,000 ක් සහ රුපියල් 150,000 ක් ලෙස රජයේ තේ වගා සහනාධාරය ඉහළ නැංවීම ද තේ වගාවේ සංවර්ධනයට ප්‍රධානතම හේතුවක් විය.

සමලෝචිත වර්ෂයේදී කොළඹ තේ වෙන්දේසියේ තේ කිලෝග්‍රෑමයක සාමාන්‍ය අලෙවි මිල රුපියල් 391.64 ක් ලෙස වාර්තා වූ අතර, 2011 වර්ෂයේදී වාර්තා වූ කිලෝග්‍රෑමයකට රුපියල් 359.89 ට සාපේක්ෂව එය සියයට 8.8 ක වර්ධනයකි. තවද, 2011 වර්ෂයේදී නැව්ගත කිරීම දක්වා වියදම් සඳහා වූ (FOB) මිල කිලෝග්‍රෑමයකට රුපියල් 511.08 ක් වූ අතර, 2012 වර්ෂයේදී එය කිලෝග්‍රෑමයකට රුපියල් 563.94 ක් දක්වා සියයට 10.3 කින් වැඩි වී ඇත.

2012 වර්ෂයේදී ප්‍රති අපනයනය ද ඇතුළත්ව අපනයනය කරන ලද තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 319.9 ක් වූ අතර, එයින් උපයන ලද අපනයන ආදායම රුපියල් මිලියන 180,430 කි. 2011 හා 2012 වර්ෂයන්හි තේ අපනයනය හා ප්‍රති අපනයනය පහත වගුවෙන් දැක්වේ.

**3.3 වගුව**

**2011 හා 2012 වර්ෂයන්හි තේ අපනයන හා ප්‍රති අපනයන දත්තයන්**

| වර්ෂය | අපනයන | | | ප්‍රති අපනයන | | | මුළු අපනයන | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය කි.ග්‍රෑ.මි | **FOB** මිල (රු/ කි.ග්‍රෑ) | ආදායම රු.මි | ප්‍රමාණය කි.ග්‍රෑ.මි | **FOB** (රු/ කි.ග්‍රෑ) | ආදායම රු.මි | ප්‍රමාණය කි.ග්‍රෑ.මි | **FOB** මිල (රු/ කි.ග්‍රෑ) | ආදායම රු.මි |
| 2011 | 303.2 | 500.64 | 151,777 | 19.4 | 674.18 | 13,077 | 322.6 | 511.08 | 164,854 |
| 2012 | 306.0 | 552.26 | 169,015 | 13.9 | 820.84 | 11,415 | 319.9 | 563.94 | 180,430 |

ඉහත වගුව අනුව, 2011 වර්ෂයේදී වාර්තා වූ තේ කිලෝග්‍රෑම් මිලියන 322.6 ක් අපනයනයෙන් ඉපැයූ රුපියල් මිලියන 164,854 ට සාපේක්ෂව 2012 වර්ෂයේදී අපනයන ආදායම රුපියල් මිලියන 15,576 කින් ඉහළ ගියද, 2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සමස්ත අපනයන ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 2.7 (සියයට 0.8) කින් අඩු වී ඇත. ශ්‍රී ලංකා තේ අපනයනයේ දෙවන ප්‍රධාන ගැනුම්කරු වූ ඉරානයට එරෙහි ඇමෙරිකානු සම්බාධක පැවතීමත්, තෙවන ප්‍රධාන ගැනුම්කරු වූ සිරියාව තුළ පැවැති සිවිල් යුධ තත්ත්වයත් මේ සඳහා බලපාන ලද ප්‍රධාන සාධකයන් විය.

2012 වර්ෂයේදී ප්‍රධානතම ගැනුම්කරුවන් දස දෙනා විසින් මිලදී ගනු ලැබූ තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 214.16 ක් වූ අතර, එය මුළු තේ අපනයනයෙන් සියයට 67 කි. 2011

හා 2012 වර්ෂයන්හිදී ප්‍රධාන ගැනුම්කරුවන් වෙත අපනයනය කරන ලද තේ ප්‍රමාණය හා එහි වටිනාකම පහත වගුවෙන් දැක්වේ.

**3.4 වගුව**

**2011 හා 2012 වර්ෂයන්හිදී ප්‍රධාන ගැනුම්කරුවන් වෙත අපනයනය කරන ලද තේ ප්‍රමාණය හා එහි වටිනාකම**

| රට | 2011 | | 2012 | |
|---|---|---|---|---|
| | අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ. මි) | වටිනාකම (රු.මි) | අපනයන ප්‍රමාණය (කි.ග්‍රෑ. මි) | වටිනාකම (රු.මි) |
| රුසියාව | 49.13 | 24,709 | 47.25 | 26,862 |
| ඉරානය | 30.94 | 17,074 | 38.13 | 22,360 |
| සිරියාව | 22.62 | 9,041 | 23.48 | 10,636 |
| ඉරාකය | 19.17 | 8,493 | 23.13 | 11,459 |
| තුර්කිය | 28.76 | 13,747 | 24.72 | 13,239 |
| ලිබියාව | 11.65 | 6,280 | 9.55 | 6,058 |
| එක්සත්අරාබි එමීර් රාජ්‍යය | 7.41 | 2,574 | 16.33 | 6,452 |
| අසර්බයිජාන් | 11.97 | 5,800 | 10.59 | 5,700 |
| ජපානය | 7.29 | 3,471 | 9.40 | 4,504 |
| කුවේට් | 21.76 | 10,776 | 11.58 | 6201 |
| **එකතුව** | **210.70** | **101,965** | **214.16** | **113,471** |

2011 වර්ෂයේදී මෙන්ම, 2012 වර්ෂයේදී ද ශ්‍රී ලංකා තේ අපනයනයේ ප්‍රධානතම ගැණුම්කරු වූයේ රුසියාවයි. සමාලෝචිත වර්ෂයේ මුළු තේ අපනයනයෙන් රුසියාව විසින් මිලදීගත් ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 47.25 කි. එය, මුළු තේ අපනයනයෙන් සියයට 14.8 කි. සමාලෝචිත වර්ෂයේදී ශ්‍රී ලංකාවේ දෙවන ප්‍රධාන තේ ගැනුම්කරු වූ ඉරානය මිලදී ගත් තේ ප්‍රමාණය කිලෝග්‍රෑම් මිලියන 38.13 කි. තවද, 2011 වර්ෂයේදී තේ අපනයනයෙන් උපයන ලද සෙස් බදු ආදායම රුපියල් මිලියන 2,057 ක් වූවද, 2012 වර්ෂයේදී එය රුපියල් මිලියන 2051.4 ක් දක්වා සියයට 0.3 කින් පමණ අඩු වී ඇත.

සමස්ත තේ කර්මාන්තයේ සංවර්ධනය උදෙසා සමාලෝචිත වර්ෂය තුළදී ඉටු කරන ලද ප්‍රමුඛතම කාර්යයන් පහත දැක්වේ.

I. අපනයනය කරනු ලබන සෑම තේ කිලෝවක් සඳහාම රුපියල් 3.50 බැගින් බද්දක් අපනයනකරුවන්ගෙන් අයකර වාර්ෂිකව රුපියල් බිලියනය බැගින් අවුරුදු 5 ක කාලයක් සඳහා රුපියල් බිලියන 5 ක අරමුදලක් පිහිටුවීමට ක්‍රියා කිරීම. මේ යටතේ පුළුල් ජාත්‍යන්තර හා දේශීය වෙළෙඳ ප්‍රවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතී.

II. තේ ක්ෂේත්‍රයේ කටයුතු සඳහා අවශ්‍ය නව ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැකසීම හා ක්‍රියාත්මක කිරීම.

III. තේ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමග සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව වර්ධනය කිරීම.

IV. තේ ක්ෂේත්‍රයේ රෝපණ ද්‍රව්‍ය සහ පොහොර මිශ්‍රන සම්බන්ධ විශේෂ කමිටුවක් පත්කොට ගැටළු නිරාකරණය කිරීම.

V. තේ නැවත වගාව සහ නව වගාව සඳහා ලබාදෙන සහනාධාර වැඩිකිරීමට අදාළ රෙගුලාසි පැනවීමේ කටයුතු සිදුකිරීම.

VI. භූගෝලීය දර්ශක 7 කට අනුව එනම්, නුවරඑළිය, උඩපුස්සැල්ලාව, දිඹුල, ඌව, මහනුවර, රුහුණ සහ සබරගමුව ලෙස ශ්‍රී ලංකා තේ නාමය හා සිංහ ලාංඡනය (Lion Logo) දේශීය හා විදේශීය රටවල ලියාපදිංචි කිරීම.

VII. මැද පෙරදිග රටවල උද්ගතව පැවති අර්බුද හේතුවෙන් තේ අපනයනයට බලපෑ අහිතකර තත්ත්වයන් අවම කිරීමට රාජ්‍ය තාන්ත්‍රික වශයෙන් මැදිහත්වීම.

VIII. වෙනස්වන දේශගුණික තත්ත්වයන්ට ඔරොත්තුදෙන සහ ඉහළ ඵලදායීතාවයක් සහිත 5000 කාණ්ඩයට අයත් නව තේ ප්‍රභේද ක්ෂේත්‍රයට හඳුන්වාදීමට අවශ්‍ය පර්යේෂණ තව දුරටත් පවත්වාගෙනයාම.

IX. ගුණාත්මයෙන් ඉහළ තේ පැළ ඒ ඒ දිස්ත්‍රික්ක තුළදීම ලබාදීම සඳහා තවාන් සංවර්ධනය හා නව තවාන් දිස්ත්‍රික්ක මට්ටමින් ඇති කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

X. ව්‍යාප්ති කටයුතු තුළින් තේ නව වගාව හා පාළු සිටුවීම සඳහා කුඩා තේ වතු හිමියන් යොමු කිරීම.

XI. පාංශු පර්යේෂණ සිදුකර පසෙහි ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම සඳහා නිර්දේශ ඉදිරිපත් කිරීම.

XII. කුඩා තේ වගාකරුවන්ගේ අදහස් හා යෝජනා සැලකිල්ලට ගෙන, දිවයිනේ ස්ථාන 26 ක පවත්වන ලද අනුවර්තන පර්යේෂණවලින් ලබා ගන්නා ලද ප්‍රතිඵල මත ඵලදායීතාව වැඩි කිරීම සඳහා නව පොහොර නිර්දේශයන් ලබා දීමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීම.

XIII. ගරු අමාත්‍යතුමා අදාළ සියළුම ආයතනයන්හි ප්‍රධාන නිලධාරීන් සමග දිස්ත්‍රික්/ කලාප මට්ටමින් තේ කර්මාන්තයේ නිරත ගොවීන් හා පාර්ශවකරුවන් හමුවී ඔවුන්ගේ ගැටළු විසඳීම සහ අදහස් හා යෝජනා ලබා ගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

XIV. පසු අස්වනු හානිය වැළැක්වීම සඳහා සහනාධාර යටතේ දළු බහාලන ප්ලාස්ටික් කූඩ ලබා දීම, දළු ප්‍රවාහනය කරනු ලබන වාහන තුළ රාක්ක සවිකිරීම ආදී කාර්යයන් සිදු කිරීම.

XV. ගුණාත්මක තේ නිෂ්පාදනයන් වෙළෙඳපොළට සැපයීම සඳහා ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව තත්ත්ව පාලන කටයුතු හා තේ කර්මාන්තශාලා නවීකරණ වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම.

XVI. දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රු.මි. 9.6 ක වැය දරා තේ පැළ 453,656 ක් ද, තේ වගාවේ අතුරු භෝගයක් ලෙස ගම්මිරිස් වගාව සඳහා ගම්මිරිස් පැළ 19,418 ක් ද, තේ දළුවල ගුණාත්මකභාවය සහ ඵලදායකත්වය වර්ධනය කිරීම සඳහා තේ කූඩ 2,140 ක් ද කුඩා තේ වතු හිමියන් අතර බෙදා දී ඇත.

XVII. 2013 අයවැය ඉලක්ක කර ගනිමින් කුඩා තේ වතුවල තේ දළු නෙලා ගැනීමේ ඵලදායිත්වය පුළුල් කර ගැනීම උදෙසා නව යාන්ත්‍රික උපකරණ ප්‍රචලිත කිරීම සඳහා වන නව ව්‍යාපෘති යෝජනාවක් මුදල් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම.

## 3.2 රබර් ක්ෂේත්‍රය

වර්ෂ 1876 දී සර් හෙන්රි විකම් ( Sir Henry Wickham) විසින් මෙරටට හඳුන්වා දෙන ලද රබර් වගාව, ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික රබර් වගා ප්‍රදේශ වන කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ, ගාල්ල, මාතර, කුරුණෑගල, බදුල්ල, රත්නපුර හා කෑගල්ල යන දිස්ත්‍රික්කයන් හි ව්‍යාප්තව පවතී. ඊට අමතරව, සාම්ප්‍රදායික නොවන ප්‍රදේශ වන මොණරාගල, හම්බන්තොට හා අම්පාර යන දිස්ත්‍රික්කයන්හි ද රබර් වගාව ආරම්භ කර ඇති අතර, උතුරු පළාතේ මුලතිව් හා වව්නියාව යන දිස්ත්‍රික්කයන්හි ද රබර් වගාව ව්‍යාප්ත කිරීමට අදාළ මූලික කටයුතු ක්‍රියාත්මක කර ඇත.


රබර් කර්මාන්තයට අදාළ දැක්ම වන්නේ ගුණාත්මක හා ඵලදායී වගාවක් ව්‍යාප්ත කිරීම තුළින් ජාතික නිෂ්පාදනය ඉහළ නැංවීමටත්, විදේශ විනිමය වර්ධනය කිරීමටත්, රබර් කර්මාන්තයේ නියැළී සිටින ජනතාවගේ ආර්ථික හා සමාජයීය තත්ත්වය සංවර්ධනය කිරීමටත් හැකි පරිසරයක් නිර්මාණය කිරීමයි. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, රබර් පර්යේෂණ ආයතනය සහ තුරුසවිය අරමුදල යන ආයතන මගින් සමාලෝචිත වර්ෂය තුළදී ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩ සටහන් තුළින් ගුණාත්මක සහ ප්‍රමාණාත්මක වශයෙන් ඵලදායි වගාවක් ලෙසින් තවදුරටත් රබර් වගාව සංවර්ධනය කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිණ.

2012 වර්ෂයේදී හෙක්ටයාර 128,120 ක භූමි ප්‍රමාණයක රබර් වගාව ව්‍යාප්තව පැවති අතර, එයින් හෙක්ටයාර 79,604 (සියයට 62) ක් කුඩා රබර් වතු අංශයට අයත් විය. තවද, හෙක්ටයාර 46,943 (සියයට 36.6) ක් ප්‍රාදේශීය වැවිලි සමාගම් 19 ක් සතු වූ අතර, හෙක්ටයාර 1,573 (සියයට 1.4) ක් රාජ්‍ය ආයතන යටතේ පැවතිණ. මෙම වගා ඉඩම් ප්‍රමාණයෙන් පරිණත ( කිරි කපන ) රබර් ඉඩම් ප්‍රමාණය වූයේ හෙක්ටයාර 101,700 (සියයට 79.4) කි.

පූර්ව වර්ෂයේදී වාර්තා වූ මෙට්‍රික්ටොන් 158,198 ට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී රබර් නිෂ්පාදනය මෙට්‍රික්ටොන් 152,050 දක්වා සියයට 3.9 කින් පහත වැටුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු වූයේ 2012 වර්ෂයේ සම්ප්‍රදායික රබර් වගා ප්‍රදේශවල පැවති අධික වර්ෂාපතනය හේතුවෙන් කිරි කපන දින ගණන අඩුවීමත්, 2011 වර්ෂයේ පැවති වාර්තාගත ඉහළ මිල ගණන්වලට සාපේක්ෂව 2012 වර්ෂයේදී රබර් මිල ගණන් පහළ යාමත්ය. 2012 වර්ෂයේදී ද සමස්ත රබර් නිෂ්පාදනය තුළ ෂීට් රබර් නිෂ්පාදනය ඉහළ අගයක් ගනු ලැබූ අතර, වර්ෂය තුළ නිපදවන ලද මුළු ෂීට් රබර් ප්‍රමාණය මෙට්‍රික්ටොන් 59,242 (සියයට 39) කි. 2011 හා 2012 වර්ෂයන්හි නිපදවන ලද විවිධ වර්ගයේ රබර් නිෂ්පාදන ප්‍රමාණයන් 3.2 රූප සටහනෙන් දැක්වේ.

**3.2 රූප සටහන**

**2011 හා 2012 වර්ෂයන්හිදී රබර් නිෂ්පාදනයේ වර්ගීකරණය**





2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සමස්ත රබර් නිෂ්පාදනයට ඉහළ දායකත්වයක් සපයනු ලබන ෂීට් රබර් හා ලේටෙක්ස් ක්‍රේප් රබර් නිෂ්පාදනය පිළිවෙලින් මෙට්‍රික්ටොන් 1,457 (සියයට 2.4) කින් හා මෙට්‍රික්ටොන් 23,383 (සියයට 39) කින් අඩු වී ඇත. සමාලෝචිත වර්ෂයේ පැවති අධික වර්ෂාපතනය හා පෙර වර්ෂයට සාපේක්ෂව පහළ ගිය මිල ගණන් කුඩා රබර් වතු හිමියන්ගේ මනා කෘෂිකාර්මික පිළිවෙත් භාවිතය කෙරෙහි තරමක් දුරට අහිතකර ලෙස බලපෑම මීට ප්‍රධාන හේතුන් විය.

තේ අංශයේ මෙන්ම රබර් අංශයේද නිෂ්පාදනය සඳහා වැඩි දායකත්වයක් සැපයෙන්නේ කුඩා ඉඩම් හිමියන්ගෙනි. ජාතික රබර් නිෂ්පාදනය සඳහා ඔවුන්ගේ දායකත්වය සියයට 80 ක් පමණ වේ. ජාතික පොහොර සහනාධාර වැඩසටහන යටතේ කුඩා රබර් වතු හිමියන් වෙත අඛණ්ඩව ලබාදුන් පොහොර සහනාධාරය හා 2011 මැයි මස සිට සංස්ථායික අංශයට ද ලබාදුන් රජයේ පොහොර සහනාධාරය හේතුවෙන් අහිතකර කාලගුණික තත්ත්වයන් හා සාපේක්ෂ අඩු මිල ගණන් මාධ්‍යයේ වුව ද 2012 වර්ෂයේදී රබර් නිෂ්පාදනයේ විශාල අඩුවීමක් සිදු නොවුණි.

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සියළුම රබර් වර්ගවල සාමාන්‍ය මිලෙහි අඩුවීමක් සිදුවිය. 2011 සහ 2012 වර්ෂයන්හි විවිධ රබර් වර්ගයන් සඳහා කොළඹ රබර් වෙන්දේසියේ වාර්තා වූ මිල ගණන් 3.3 රූප සටහනෙන් දැක්වේ.

### 3.3 රූප සටහන

### 2011 හා 2012 වර්ෂයන්හි විවිධ රබර් වර්ගයන්හි වෙන්දේසි මිල ගණන්




2012 වර්ෂයේදී ජාත්‍යන්තර වෙළෙඳපොළ තුළ අතිරික්ත රබර් තොග පැවතීමත්, නැගෙනහිර ආසියාවේ ප්‍රධාන ටයර් නිෂ්පාදන වෙළෙඳපොළෙහි සිදු වූ ඉල්ලුමේ පහළයාමත් සමග අනෙකුත් ස්වාභාවික රබර් නිෂ්පාදනය කරනු ලබන රටවල රබර් කර්මාන්තයේ සිදු වූ වර්ධනයත් මෙලෙස රබර් මිල ගණන් පහළයාම කෙරෙහි මූලිකව බලපාන ලදී.

සමාලෝචිත වර්ෂයේදී රජය විසින් රබර් නැවත වගාව හා නව වගාව සඳහා පිළිවෙලින් හෙක්ටයාරකට රුපියල් 175,000 ක් සහ රුපියල් 150,000 ක සහනාධාරයක් ලබාදීම රබර් වගාවේ සංවර්ධනයට ප්‍රධානතම හේතුවක් විය. එම සංශෝධිත සහනාධාරය යටතේ රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රබර් නව වගා සහ නැවත වගා වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාවට නංවන ලද අතර, ඉහළ සහනාධාරය හේතුවෙන් රබර් වගාව කෙරෙහි කුඩා රබර් වතු හිමියන්ගේ උනන්දුව තවදුරටත් වැඩිවිය. සමාලෝචිත වර්ෂයේදී රබර් සංවර්ධන දෙපාර්තමේන්තුවේ රබර් නැවත වගා සහනාධාර වැඩසටහන යටතේ ලබාදුන් රුපියල් මිලියන 162 ක සහනාධාරය මගින් රබර් නැවත වගා කරන ලද මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2,161 කි. එයින් හෙක්ටයාර 1,117 ක් එනම්, සියයට 51.7 ක් සාම්ප්‍රදායික ප්‍රදේශයන්හි කුඩා රබර් වතු අංශයේ වූ අතර, හෙක්ටයාර 1,044 ක් එනම්, සියයට 48.3 ක් වැවිලි සමාගම් සතු සංස්ථායික අංශයේ විය. තවද, 2012 වර්ෂයේදී සාම්ප්‍රදායික හා සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල ක්‍රියාත්මක කරන ලද රබර් නව වගා වැඩසටහන සඳහා ලබාදුන් සහනාධාරයේ වටිනාකම රුපියල් මිලියන 125.43 ක් වූ අතර,

වගාකළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,475 කි. එයින් හෙක්ටයාර 1,018 (සියයට 41) ක් සාම්ප්‍රදායික ප්‍රදේශවල වූ අතර, හෙක්ටයාර 251 (සියයට 10) ක් සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල විය. තවද, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල ( IFAD ) යටතේ සාම්ප්‍රදායික නොවන මොණරාගල දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 1,027 (සියයට 41.5) ක් වගා කිරීම සුවිශේෂී ජයග්‍රහණයකි. එසේම සංස්ථායික අංශයේ හෙක්ටයාර 179 (සියයට 7) ක් ද අළුතින් රබර් වගාකර ඇත.

තව ද, රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව, රබර් පර්යේෂණ ආයතනය, තුරුසවිය අරමුදල හා ජාතික වැවිලි කළමනාකරණ ආයතනය මගින් 2012 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද පුහුණු වැඩසටහන් හේතුවෙන් රබර් වගාවේ නියුතු ගොවීන් තුළ පොහොර යෙදීම, වැසි ආවරණ භාවිතය, ගුණාත්මක රබර් ෂීට් නිෂ්පාදනය හා තාක්ෂණික දැනුම ලබාගැනීමේ අඛණ්ඩ වර්ධනයක් ද සිදුවිය.

2012 වර්ෂයේදී රබර් අපනයනය තුළින් උපයන ලද මුළු විදේශ විනිමය ප්‍රමාණය රුපියල් මිලියන 125,179 ක් වූ අතර, එය පෙර වසරේ ඉපැයූ ආදායම වන රුපියල් මිලියන 120,644 ට සාපේක්ෂව සියයට 3.8 ක වර්ධනයකි. විවිධ වර්ගයේ රබර් අපනයනය තුළින් 2011 හා 2012 වර්ෂයන්හි ලද අපනයන ආදායම 3.5 වගුවෙන් දැක්වේ.

**3.5 වගුව**

**2011 හා 2012 වර්ෂයන්හි විවිධ වර්ගයේ රබර් අපනයන්හි වටිනාකම**

**රුපියල් මිලියන**

| වර්ගය | අපනයන වටිනාකම | |
|---|---|---|
| | **2011** | **2012** |
| අමු රබර් | 22,811 | 15,726 |
| අර්ධ නිමි | 2,664 | 5,532 |
| නිමි භාණ්ඩ | 95,169 | 103,921 |
| **මුළු එකතුව** | **120,644** | **125,179** |

තවද, 2012 වර්ෂයේදී අමු රබර් අපනයනය මෙට්‍රික්ටොන් 37,377 ක් වූ අතර, එය වසරේ මුළු රබර් නිෂ්පාදනය වන මෙට්‍රික්ටොන් 152,050 ට සාපේක්ෂව සියයට 2.5 ක අගයකි. නමුත්, 2011 වර්ෂයේදී අමු රබර් අපනයනය කළ ප්‍රමාණය වූ මෙට්‍රික්ටොන් 42,605 හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේදී අමු රබර් අපනයනයෙහි සියයට 12.3 ක පමණ අඩුවීමක් සිදුවී ඇත. ඒ සඳහා මූලික හේතුව වූයේ 2012 වර්ෂයේදී අමු රබර් මෙට්‍රික්ටොන් 110,038 ක් දේශීය වශයෙන් අගය එකතු කිරීමට භාජනය කිරීමයි. ඒ අනුව සමාලෝචිත

වර්ෂයේදී අගය එකතු කළ නිෂ්පාදන අපනයනයෙන් රුපියල් මිලියන 109,453 ක් ඉපැයූ අතර, 2011 වර්ෂයේදී උපයන ලද රුපියල් මිලියන 97,833 ට සාපේක්ෂව එය සියයට 10 ක වර්ධනයකි.

සමස්ත රබර් කර්මාන්තයේ සංවර්ධනය උදෙසා 2012 වසරේදී ඉටු කරන ලද සුවිශේෂී කාර්යයන් පහත දැක්වේ.

I. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමට විශේෂ පියවර ගැනීම. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක රබර් වගා කිරීමේ වැඩසටහන ඇරඹීම 2012 වසරේදී සිදුවූ අතර, ඊට අදාළ ප්‍රතිපත්ති සැකසීම, සුදුසු ඉඩම් ලබා ගැනීම හා ව්‍යාප්තිය සඳහා විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සහ ව්‍යාප්ති වැඩසටහන්වල ප්‍රගතිය සමාලෝචනය සිදුකිරීම.

II. උතුරු ප්‍රදේශයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත්කර විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති සැකසීම.

III. රබර් අංශයේ තවාන් සංවර්ධනය සහ පැළවල ගුණාත්මය වර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ඇරඹීම සහ තවාන්වල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.

IV. රබර් වගාව සම්බන්ධ පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණය.

V. රබර් වගාවන්හි වැහි ආවරණ භාවිතය ප්‍රචලිත කිරීමට ආරම්භ කරන ලද විශේෂ වැඩසටහන ක්‍රියාවට නැගීම අධීක්ෂණය කිරීම සහ පහසුකම් සැලසීම.

VI. රබර් අංශයේ කටයුතු සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැකසීම සහ ක්‍රියාත්මක කිරීම.

VII. රබර් නව වගාව සහ නැවත වගාව සඳහා ලබාදෙන සහනාධාර වැඩිකිරීමට අදාළ රෙගුලාසි පැනවීමට අදාළ කටයුතු ඉටු කිරීම.

VIII. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල වගා කිරීමට සුදුසු භූමිය හඳුනා ගැනීමේ පර්යේෂණ තව දුරටත් සිදු කිරීම සහ උතුරු පළාතේ රබර් වගා කිරීමේ යෝග්‍යතාවය පිළිබඳ පර්යේෂණ කටයුතු අඛණ්ඩව ව්‍යාප්ත කිරීම තුළින් වගා කළ හැකි ප්‍රදේශ ලෙස වව්නියාව හා මුලතිව් දිස්ත්‍රික්කයන් හඳුනා ගැනීම.

IX. 2012 අයවැය යෝජනාවලට අනුව අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක අලුතින් රබර් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම, ඉඩම් නිදහස් කර ගැනීමට කටයුතු කිරීම, ව්‍යාප්ති කටයුතු හා වගා කටයුතු ඇරඹීම සඳහා මූලික කටයුතු සංවිධානය කිරීම.

X. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවලට පැළ සැපයීම සඳහා පදියතලාව ප්‍රදේශයේ නව පැළ තවානක් ඇරඹීමට ඉඩම් පවරා ගැනීම සහ මූලික ඉදිකිරීම් ඇරඹීමට ක්‍රියා කිරීම.

XI. රබර් වගාවේ වැසි ආවරණ භාවිතය තවදුරටත් පුළුල් කිරීමට කුඩා ඉඩම් හිමි ගොවීන්ට මෙන්ම වැවිලි සමාගම්වලට ගෙවනු ලබන සහනාධාර අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම හා ඒ පිළිබඳව දැනුවත් කිරීම් තවදුරටත් පවත්වා ගෙන යාම.

XII. දිවි නැගුම වැඩසටහන යටතේ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද රුපියල් මිලියන 18.4 ක වැය දරා කුඩා ගොවීන් වෙත රබර් පැළ ලබාදීම, අතුරු භෝග වගාවක් ලෙස පළතුරු පැළ ලබාදීම, නව තාක්ෂණයෙන් යුත් කිරිපිහි 2528 ක් ලබාදීම, කුඩා කර්මාන්තකරුවන් 5 දෙනෙකු දිරිගැන්වීම සහ හැඩිගල්ල, යට්ටපාත, කරවිට ජනපදය, පන්දෙණිය යන ප්‍රදේශයන්හි සමූහ සැකසුම් මධ්‍යස්ථාන 4 ක් ආරම්භ කිරීමේ කටයුතු සිදු කිරීම මෙන්ම රබර් වගාව ගෙවතු වගාවක් ලෙස ප්‍රචලිත කිරීම සඳහා කටයුතු කිරීම.

XIII. රජයේ රබර් පැළ තවාන්වල යටිතල පහසුකම් සංවර්ධනය සහ පැළ නිෂ්පාදනය වැඩි කිරීමට අවශ්‍ය පියවර ගැනීම.

XIV. රබර් වගා බිම්වල අපරිණත අවධියේ අතුරු බෝග වගාව දිරිමත් කිරීම හා අවශ්‍ය පහසුකම් සැලසීම.

XV. කිරි කපන්නන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්ෂේත්‍රය වෙතම ගොස් අඛණ්ඩව පැවැත්වීම.

XVI. යහපත් කෘෂිකාර්මික පරිචයන් සහ පොහොර යෙදීමේ නිවැරදි ක්‍රමවේදයන් පිළිබඳ ගොවීන් දැනුවත් කිරීමේ පුහුණු වැඩසටහන් පැවැත්වීම.

XVII. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා අදාළ නිලධාරීන්ද කැටුව අදාළ දිස්ත්‍රික්කවලට ගොස් ගොවි හමුවීම් පවත්වා ඔවුන්ගේ ගැටළුවලට විසඳුම් ලබා දීම හා ඔවුන්ගේ අදහස් හා යෝජනාද ඉදිරි සැලසුම් සඳහා ලබා ගැනීම.

## 3.3 කටුපොල් ක්ෂේත්‍රය

කටුපොල් වගාවේ දැක්ම වනුයේ දේශීය බාද්‍ය තෙල් අවශ්‍යතාව පිරිමසා ගැනීම සඳහා වාණිජ බෝගයක් ලෙස කටුපොල් වගාව සංවර්ධනය කිරීම තුළින් ජාතික ආර්ථිකයට දායකත්වයක් ලබාදීම හා බාද්‍ය තෙල් ආනයනය සඳහා වැයවන විදේශ විනිමය ඉතිරිකර ගැනීමයි. හෙක්ටයාර 7,533ක භූමි ප්‍රමාණයක කටු පොල් වගාව ව්‍යාප්තව පවතින අතර, එම වගා ප්‍රමාණයෙන් හෙක්ටයාර 7,514 ක් ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ ද හෙක්ටයාර 18.85 ක් රාජ්‍ය වැවිලි සංස්ථාව යටතේ ද ක්‍රියාත්මක විය.

**3.6 වගුව**

**කටුපොල් වගාවේ ව්‍යාප්තිය පිළිබඳ දත්ත**

**හෙක්ටයාර්**

| වැවිලි සමාගමේ නම | පරිණත වගා සහිත ඉඩම් ප්‍රමාණය | අපරිණත වගා සහිත ඉඩම් ප්‍රමාණය | මුළු ඉඩම් ප්‍රමාණය |
|---|---|---|---|
| අගලවත්ත | 947.00 | 354.00 | 1301.00 |
| වටවල | 1909.51 | 1161.6 | 3071.11 |
| නමුණුකුල | 1061.21 | 536.29 | 1597.50 |
| ඇල්පිටිය | 781.63 | 427.82 | 1209.45 |
| කොටගල | - | 334.76 | 334.76 |
| ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (SLSPC) | 18.85 | - | 18.85 |
| | **4,718.20** | **2,814.47** | **7,532.67** |

වැවිලි සමාගම්වල කටුපොල් වගා කිරීමේදී අවශ්‍ය බීජ තීරු බදු සහන යටතේ ආනයනය කිරීම සඳහා අවශ්‍ය නිර්දේශයන් ලබාදීම සහ කටුපොල් වගාවෙන් ලබාගත හැකි ප්‍රයෝජන සහ එය ව්‍යාප්ත කිරීමේ වැදගත්කම පිළිබඳව කෙරෙන අධ්‍යයන කටයුතු සහ ප්‍රචාරණ කටයුතු සම්බන්ධීකරණය මෙම අමාත්‍යාංශය මගින් සිදු කෙරේ. ඒ අනුව 2012 වර්ෂයේදී වැවිලි සමාගම්වල වගා කිරීමට අවශ්‍ය වූ බීජ ඇට 176,000 ක් තීරුබදු සහන යටතේ ආනයනය කිරීම සඳහා නිර්දේශය ලබා දී ඇත.

## 3.4 විදේශ ණය මගින් ක්‍රියාත්මක සංවර්ධන ව්‍යාපෘති

### 3.4.1 කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන

කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන, කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදල (IFAD) මගින් ශ්‍රී ලංකා රජයේ උපදේශකත්වය යටතේ ආරම්භ කර, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලැබේ. එමගින්, මැදරට ප්‍රදේශයේ ආන්තික ඉඩම් හිමි කුඩා තේ වැවිලිකරුවන්ගේ සහ මොණරාගල ප්‍රදේශයේ අන්තර් මධ්‍ය කලාපයේ රබර් වගාව සඳහා යොමුවීමට කැමති, ගොඩබිම් ආහාර බෝග වගාවෙහි නියුතු දිළිඳු ගොවීන්ගේ ආදායම් මට්ටම සහ ජීවන තත්ත්වය තිරසාර ලෙස නංවාලීමට අපේක්ෂා කෙරේ.

මෙම වැඩසටහනේ අරමුණ වන්නේ, කුඩා පරිමාණ බෝග නිපදවන්නන්ගේ ජීවනෝපාය මාර්ග සහ සමාජ තත්ත්වයන් තිරසාර ලෙස වැඩිදියුණු කිරීමයි. බිම් මට්ටමින් කණ්ඩායම් පිහිටුවීම තුළින් ප්‍රතිලාභීන්ගේ ශක්‍යතාවන් සහ නිපුණතාවන් ශක්තිමත් කිරීම, ඉඩම් භුක්තිය පිළිබඳ තත්ත්වය වැඩිදියුණු කිරීම සහ ඉඩම් යෝග්‍යතාව අනුව ලාභදායී සහ තිරසාර කුඩා පරිමාණ වගාක්‍රම (smallholder farming systems) සංවර්ධනය කිරීම හා උසස් කළමනාකරණ තාක්ෂණ සහිත සුදුසු බෝග / පශු සම්පත් ආදර්ශ හඳුන්වාදීම තුළින් ඉඩම් ඵලදායීතාව වර්ධනය කිරීම, පසු අස්වනු පාලනය, ගබඩාකිරීම සහ පිරිසැකසුම, අලෙවිය හා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් වැඩිදියුණු කිරීම මගින් නිෂ්පාදකයින්ගේ ලාභ වැඩිකිරීම, වැඩිදියුණු කළ හා ප්‍රතිලාභීන් විසින් කෘෂිකාර්මික සහ ආදායම් ඉපයීමේ කාර්යයන් සඳහා මූල්‍ය ආයෝජන සිදුකිරීම දක්වා ව්‍යාප්ත කරන ලද ග්‍රාමීය මූල්‍ය සහ ණය සේවාවන් යනාදිය ඉලක්ක කරගත් මැදිහත්වීම් සමුදායක් ක්‍රියාත්මක කිරීම තුළින් ඉහත අරමුණ කරා ළඟාවීමට අපේක්ෂා කෙරේ.

කොළඹ පිහිටි ජාතික වැඩසටහන් සම්බන්ධීකරණ ඒකකය, ගම්පොළ පිහිටි මැදරට උප වැඩසටහන් කළමනාකරණ ඒකකය සහ මොණරාගල පිහිටි මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකය මගින් කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කරනු ලැබේ.

මෙම වැඩසටහනේ මුළු පිරිවැය ඇමෙරිකානු ඩොලර් මිලියන 28.04 ක් වන අතර, එය කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ (ඇමෙරිකානු ඩොලර් මිලියන 22.540), ශ්‍රී ලංකා රජයේ (ඇමෙරිකානු ඩොලර් මිලියන 3.763), ප්‍රතිලාභීන්ගේ (ඇමෙරිකානු ඩොලර් මිලියන 1.0103) සහ සහභාගීත්ව මූල්‍ය ආයතනවල (ඇමෙරිකානු ඩොලර් මිලියන 0.715) අරමුදල්වලින් සමන්විත වේ. මෙම වැඩසටහන ක්‍රියාත්මකවීමේ පස්වන වසර 2012 දෙසැම්බර් මාසයේදී අවසන් විය.

### 3.4.1.1 2012 වසරේ මූල්‍ය ප්‍රගතිය

2012 වර්ෂය සඳහා අනුමත මූල්‍ය ප්‍රතිපාදනය රුපියල් මිලියන 573 ක් වූ අතර, වියදම රුපියල් මිලියන 450.09 ක් විය. එනම්, 2012 වර්ෂයේ ප්‍රතිපාදනයට සාපේක්ෂව සියයට 79 ක වාර්ෂික මූල්‍ය ප්‍රගතියකි. එමෙන්ම, 2012 දෙසැම්බර් අවසන් වනවිට සියයට 44 ක සමුච්චිත මූල්‍ය ප්‍රගතියක් ද ළඟාකරගෙන ඇත. 2012 මූල්‍ය ප්‍රගතිය මීට වඩා වැඩි අගයක් ගැනීමට නියමිතව පැවතුන ද මොණරාගල රබර් වගා වැඩසටහන, නොවැම්බර් මස ඇරඹෙන වර්ෂාව සමග ක්‍රියාත්මක කළයුතු නිසා භෞතික ප්‍රගතිය ලගා කරගනු ලැබුවද, ඇතැම් කාර්යන්ට මුදල් ගෙවීම ඊළඟ වර්ෂයට ගමන් කිරීම ඊට හේතුවිය.

**3.7 වගුව**

**කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනෙහි මූල්‍ය තොරතුරු**

**රුපියල් මිලියන**

| **ආධාරක ආයතනය** | **සමුච්චිත ප්‍රගතිය** | | | **2012 වර්ෂයේ ප්‍රගතිය** | | |
|---|---|---|---|---|---|---|
| | මුළු ඇස්තමේන්තු පිරිවැය | 2012 සිව්වන කාර්තුව අවසානයේදී සමුච්චිත වියදම | 2012 සිව්වන කාර්තුව අවසානයේදී ප්‍රයොජනයට ගත් % | 2012 සඳහා අයවැය ප්‍රතිපාදනය | 2012 සිව්වන කාර්තුව අවසානයේදී වියදම | 2012 සිව්වන කාර්තුව අවසානයේදී වියදම් % |
| ශ්‍රී ලංකා රජය | 383.98 | 93.01 | 24% | 37.00 | 25.08 | 68% |
| කෘෂිකර්ම සංවර්ධනය සඳහාවූ ජාත්‍යන්තර අරමුදල | 2,300.79 | 1082.08 | 47% | 486.00 | 378.19 | 78% |
| සහභාගීත්ව මූල්‍ය ආයතන | 73.06 | 20.68 | 28% | 20.00 | 14.36 | 72% |
| ප්‍රතිලාභීන්ගේ දායකත්වය | 103.06 | 69.63 | 68% | 30.17 | 32.45 | 108% |
| **එකතුව** | **2,860.89** | **1,265.40** | **44%** | **573.17** | **450.09** | **79%** |

### 3.4.1.2 2012 වසරේ භෞතික ප්‍රගතිය

2012 වසරේදී උප වැඩසටහන් කළමනාකරණ මට්ටම්වලදී පවත්වාගෙන යන ලද වැඩසටහනේ භෞතික ප්‍රගතිය 3.8 වගුවේ සාරාංශ ගතකර ඇත.

## 3.8 වගුව

### 2012 වසරේ වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැයට සාපේක්ෂව මනින ලද භෞතික ප්‍රගතිය

| | වාර්ෂික සැලැස්ම සහ අයවැයෙහි ඉලක්කය | ලබාගත් භෞතික ප්‍රගතිය | ප්‍රගතිය % |
|---|---|---|---|
| 1. පිහිටුවන ලද ප්‍රජා කණ්ඩායම් සංඛ්‍යාව (මැදරට ව්‍යවසායකත්ව කණ්ඩායම් සහ මොණරාගල ග්‍රාමීය රබර් සංවර්ධන පර්ෂද ( VRDCs) | 110 | 110 | 100 |
| 2. පිහිටුවන ලද ප්‍රජා කණ්ඩායම්වල සිටින පුද්ගලයින් සංඛ්‍යාව | 2800 | 1525 | 54.5 |
| 3. මුදල් ගෙවූ ගැලපුම් ප්‍රදාන සංඛ්‍යාව | 252 | 450 | 178 |
| 4. ආදායම් ඉපැයීමේ කාර්යයන් සහ/හෝ බෝග නිෂ්පාදන පරිචයන් සහ තාක්ෂණයන් පිළිබඳව පුහුණුකරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | 1850 | 1730 | 93.5 |
| 5. (මැදරට) ලියාපදිංචිවී ඇති ඉතුරුම් සහ ණය කණ්ඩායම් සංඛ්‍යාව | 75 | 47 | 62.6 |
| 6. 2012 වසරේදී ඉදිකරන ලද / පුනරුත්ථාපනය කරන ලද සියලු මාර්ගවල දිග ප්‍රමාණය (කි.මී) | 18.5 | 19.24 | 104 |
| 7. (මැදරට) නිම කරන ලද ප්‍රජා ජල ව්‍යාපෘති සංඛ්‍යාව | 5 | 5 | 100 |
| 8. අත්දැකීම් හුවමාරු කර ගැනීමේ චාරිකා ( exposure visits) සංඛ්‍යාව | 6 | 4 | 66.6 |
| 9. තේ නැවත වගා කිරීමේ වැඩසටහන (මැදරට) | | | |
| • වර්ධිත කළමනාකරණ පරිචයන් යටතේ තේ ඉඩම් ප්‍රමාණය (හෙක්.) | 66 | 55 | 83.3 |
| • 2012 වර්ෂයේදී නැවත වගා කරන ලද තේ ඉඩම් ප්‍රමාණය (හෙක්.) | 40 | 47 | 117.5 |
| • අතුරුවගා කළ තේ ඉඩම් ප්‍රමාණය (හෙක්.) | 100 | 110 | 110 |
| • එළවළු / පළතුරු වගා කළ ඉඩම් ප්රමාණය (හෙක්.) | 80 | 85 | 106.3 |
| 10. රබර් වගා වැඩසටහන (මොනරාගල) | | | |
| • වර්ධිත කළමනාකරණ පරිචයන් යටතේ රබර් ඉඩම් ප්‍රමාණය (හෙක්) | 3,797 | 2868 | 75.5 |
| • වර්ධිත බෝග ආදර්ශ යටතේ ඉඩම් ප්‍රමාණය (හෙක්.)<br>➢ රබර් තනි බෝග වගාව | 900 | 1026.8 | 114 |
| ➢ කොකෝවා සමඟ රබර් වගාව | 200 | 93.36 | 46.7 |
| ➢ පළතුරු සමඟ රබර් වගාව | 50 | 30 | 60 |
| ➢ බඩඉරිඟු (මූල්‍ය බෝග) සමඟ රබර් වගාව | 200 | 364.4 | 182.2 |
| ➢ ඖෂධීය ශාක සමඟ රබර් වගාව | 10 | 1.07 | 10.7 |
| 11. පසු-නිෂ්පාදනය, පිරිසැකසුම සහ අලෙවිය පිළිබඳව පුහුණුකරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | 472 | 493 | 104.4 |
| 12. පිහිටුවන ලද අලෙවි කණ්ඩායම් සංඛ්‍යාව | 19 | 24 | 126.3 |
| 13. ස්ථාපිත අලෙවි ජාල / සම්බන්ධීකරණ සංඛ්‍යාව | 15 | 10 | 66.6 |
| 14. ව්‍යාපාර සහ ව්‍යවසායකත්වය පිළිබඳව පුහුණුකරන ලද පුද්ගලයින් සංඛ්‍යාව | 1570 | 1334 | 85 |
| 15. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් නිකුත් කරන ලද ණය සංඛ්‍යාව | 672 | 822 | 122.3 |
| 16. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් ප්‍රතිමූල්‍යයනය කරන ලද ණය වටිනාකම (රු. මිලියන) | 80 | 57.432 | 71.8 |
| 17. පුහුණුකරන ලද මූල්‍ය ආයතනවල කාර්ය මණ්ඩලය (ස්ත්‍රී/පුරුෂ) | 30 | 43 | 143 |
| 18. ව්‍යාපෘතියට සහභාගීවන මූල්‍ය ආයතන සංඛ්‍යාව | 7 | 7 | 100 |
| 19. ක්‍රියාකාරී ණය ගැනුම්කරුවන් සංඛ්‍යාව (ස්ත්‍රී/පුරුෂ) | 672 | 670 | 99.7 |
| 20. ව්‍යාපෘති සේවාවන් ලබාගන්නා පුද්ගලයින් සංඛ්‍යාව (පිරිමි) | | 4364 | |
| 21. ව්‍යාපෘති සේවාවන් ලබාගන්නා පුද්ගලයින් සංඛ්‍යාව (ගැහැණු) | | 1739 | |
| 22. ව්‍යාපෘති සේවාවන් ලබාගන්නා පුද්ගලයින් සංඛ්‍යාව ( පිරිමි සහ ගැහැණු) | | 6103 | |

2012 වසරේ සිව්වන කාර්තුව අවසන් වනවිට, ශක්‍ය බරතබන ලද (feasible weighted) සමුච්චිත භෞතික ප්‍රගතියේ සාමාන්‍යය සියයට 49.5 ක් විය.



කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන/ ප්‍රජා යටිතල පහසුකම් සංවර්ධනය සඳහා මැදරට උප වැඩසටහන් කළමනාකරණ ඒකකයේ මැදිහත්වීම යටතේ නුවරඑළිය දිස්ත්‍රික්කයේ දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මෑතකදී නිමකළ "නඩ්සා මාර්ග අංක 09"



කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන/ මැදරට උප වැඩසටහන් කළමනාකරණ ඒකකය මගින් ක්‍රියාත්මක කරනු ලබන ආදායම් ඉපැයීමේ ක්‍රියාකාරකමක් ලෙස හතු වගාව සඳහා ගැලපුම් ප්‍රදානයක් ලද ගොවි මහතෙකු .

මැදරට උප වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් 2012 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැයට සාපේක්ෂව සියයට 83 ක වියදමක් සිදුකර ඇති අතර, මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් 2012 වර්ෂයේ වාර්ෂික වැඩ සැලැස්ම සහ අයවැයට සාපේක්ෂව සියයට 77 ක වියදමක් සිදු කර ඇත. එහෙත්, 2012 දෙසැම්බර් 31 දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ඩොලර් ගිණුමේ පවත්නා අරමුදල් ප්‍රමාණවත් නොවීම හේතුකොටගෙන රබර් පැළ සඳහා අමතර රුපියල් මිලියන 33.6 ක් වටිනා නොපියවූ ඉන්වොයිසයන් පැවතුණි. එම ගෙවිය යුතු මුදල ගෙවීමෙන් අනතුරුව, මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකයේ 2012 මුදල් වර්ෂය සඳහා වූ සියයට 77 ක කාර්ය සාධනයට සාපේක්ෂව සියයට 84 ක කාර්ය සාධනයක් දක්වා වර්ධනය කරගත හැකිවිය.



කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන/ ප්‍රජා සංවර්ධන සංරවකය යටතේ මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකයේ ආධාර ඇතිව 2012 වර්ෂයේ මොණරාගල දිස්ත්‍රික්කයේ තෙලබෝගල්ල, වෙහෙරගල ඉදිකරන ලද ප්‍රවේශ මාර්ගයක්.



කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනේ කෘෂිකර්ම සංවර්ධන කාර්යයන් යටතේ 2012 වර්ෂයේ කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකයේ ආධාර ලත් බුත්තල මහගොඩයාය ග්‍රාම නිලධාරි කොට්ඨාශයේ බඩඉරිඟු වගාකරුවෙකු

තවද, මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් මෙම වර්ෂය තුළදී හෙක්ටයාර් 1,100 ක පමණ අළුතින් රබර් වගාකිරීම සාර්ථකව නිමකරනු ලැබ ඇත. එසේම, ව්‍යාපෘතිය මගින් පාළු සිටුවීම සඳහා 200,000 කට අධික පැළ සංඛ්‍යාවක්ද ලබාදී ඇත. මෙම ජයග්‍රහණයත් සමග මොණරාගල උප වැඩසටහන් කළමනාකරණ ඒකකය විසින් දෙසැම්බර් වනවිට එහි භෞතික ඉලක්කයෙන් (හෙක්ටයාර් 5000) සියයට 95 ක් සම්පූර්ණකර ඇත. ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම, ස්වයංරැකියා ඇරඹීම, සත්ත්වපාලන කටයුතු, තේ කර්මාන්තශාලා සඳහා ණය ලබාදීම වැනි ව්‍යාපෘතීන් සඳහා රුපියල් මිලියන 83 ක (ප්‍රතිමූල්‍යායනය කරන ලද එකතුව) වටිනාකමින් යුතු ණය ලබාදී ඇත.

# 4. ආංශීය කාර්ය සාධනය

## 4.1 පාලන අංශය

පාලන අංශය මගින් අමාත්‍යාංශයේ සියළුම ආයතනික සහ අභ්‍යන්තර පරිපාලන කටයුතු මෙහෙයවනු ලබයි. ඒ යටතේ පාර්ලිමේන්තු ප්‍රශ්න සම්බන්ධයෙන් ක්‍රියා කිරීම, ගොඩනැගිලි හා උපකරණ නඩත්තු කටයුතු, කාර්ය මණ්ඩල කටයුතු, අමාත්‍යාංශය යටතේ වන ආයතනවල පරිපාලන කටයුතු සම්බන්ධ රාජකාරී, ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු ආදී රාජකාරී රැසක් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

### I. කාර්ය මණ්ඩල කටයුතු: (පුහුණු හා සංවර්ධන)

අමාත්‍යාංශයේ වැටුප් ලබන සමස්ත කාර්ය මණ්ඩලය 112 දෙනෙකු වේ. මෙම සියළුම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු සම්බන්ධ කටයුතු වන වැටුප් වර්ධක, ස්ථාන මාරුවීම්, මුදාහැරීම, විශ්‍රාම ගැන්වීම, නිවාඩු සම්බන්ධ කටයුතු නිසි පරිදි සිදු කරනු ලැබේ. කාර්යාල කාර්ය සහායක හා රියදුරු යන සේවාවල කාර්ය මණ්ඩල සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග නියමිත දිනවලදී පවත්වා අවසන් කොට ඇත.

කාර්ය මණ්ඩලයේ දැනුම, හැකියාව හා කාර්යක්ෂමතාව වර්ධනය කිරීමේ අරමුණින් පුහුණු පාඨමාලා සඳහා අඛණ්ඩව නිලධාරීන් යොමු කර ඇත. මේ යටතේ දෙමළ භාෂා පුහුණු වැඩසටහන් සඳහා නිලධාරීන් 11 දෙනෙකුද, නායකත්ව හා පෞරුෂ සංවර්ධන වැඩසටහන් සඳහා නිලධාරීන් 02 දෙනෙකුද, විෂය කරුණු සම්බන්ධ වැඩසටහන් සඳහා නිලධාරීන් 10 දෙනෙකුද යොමු කර ඇත.

විදේශීය පුහුණු පාඨමාලාවන් සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 04 දෙනෙක් ද සම්මන්ත්‍රණ හා වැඩමුළු සඳහා අමාත්‍යාංශ නිලධාරීන් 07 දෙනෙක් ද සහභාගි කරවා ඇත.

රැකියා විරහිත උපාධිධාරීන් රාජ්‍ය සේවයට එක් කර ගැනීමේ රජයේ ප්‍රතිපත්තිමය තීරණය යටතේ උපාධිධාරී අභ්‍යාසලාභීන් 35 දෙනෙකු අමාත්‍යාංශයට හා අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා අනුයුක්ත කිරීමට ක්‍රියා කර ඇත.

### II. ගොඩනැගිලි හා යන්ත්‍රෝපකරණ කටයුතු

කාර්යාල පරිශ්‍රය පිරිසිදුව, ක්‍රමවත්ව හා අලංකාරව පවත්වා ගෙන යාම සඳහා නඩත්තු කටයුතු අඛණ්ඩව සිදුකරනු ලබයි. නිල නිවාසවල අලුත්වැඩියා හා නඩත්තු කටයුතු සිදු කර ඇත. වායුසමීකරණ, පරිගණක, ඡායා පිටපත් යන්ත්‍ර, ෆැක්ස් යන්ත්‍ර අලුත්වැඩියාව හා

සේවා ගැන්වීම් කටයුතු නිසි පරිදි සිදු කර ඇත. එසේම අවශ්‍යතා ඇගයීමට ලක්කර ඒ අනුව අවශ්‍ය පරිගණක සහ අනෙකුත් උපකරණ මිලදී ගැනීම සිදුකරනු ලැබීය.

### III. ප්‍රවාහන කටයුතු

අමාත්‍යාංශය සතු සමස්ත වාහන සංඛ්‍යාව 48 කි. මෙම වර්ෂය තුළ භාණ්ඩාගාරයේ අනුමැතිය මත අමාත්‍යාංශය සඳහා එක් වාහනයක් මිලදී ගෙන ඇති අතර, ජාතික අයවැය දෙපාර්තමේන්තුවෙන් ඩබල් කැබ් රථ 03 ක් අමාත්‍යාංශය වෙත ලබා දී ඇත. අමාත්‍යාංශයේ සමස්ත කටයුතු කාර්යක්ෂමව සම්බන්ධීකරණය සඳහා ප්‍රවාහන අංශය එහිදී සුවිශේෂී දායකත්වයක් ලබා දී ඇත. තවද, භාවිතයට ගත නොහැකි අබලි වාහන 04ක් ප්‍රසිද්ධ ටෙන්ඩර් කැඳවීම් මගින් විකිණීමට කටයුතු කර ඇත.

### IV. ආයතනවල මෙහෙයුම් හා ක්‍රියාත්මක කටයුතු

අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක ආයතන වන ශ්‍රී ලංකා තේ මණ්ඩලය, ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල, රබර් සංවර්ධන දෙපාර්තමේත්තුව, ශ්‍රී ලංකා රබර් පර්යේෂණ ආයතනය හා තුරුසවිය අරමුදල යන ආයතනවල පරිපාලන හා ආයතන කටයුතු සම්බන්ධයෙන් පාලන අංශය විසින් ක්‍රියා කරනු ලැබීය.

ආයතනවල අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම, කාර්ය මණ්ඩල පත් කිරීම, සේවා දීර්ඝ කිරීම, රාජකාරී විදේශ ගමන්, පෞද්ගලික විදේශ ගමන්, විදේශ ශිෂ්‍යත්ව , වාර්ෂික වාර්තා හා ඒ ඒ ආයතනවලට අදාළවන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම මේ යටතේ සිදු කර ඇත. කාර්ය මණ්ඩල ගැටළු පිළිබඳ වෘත්තීය සංගම් වලින් අමාත්‍යාංශයට ඉදිරිපත් වන ගැටළු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමද පාලන අංශය මගින් සිදු කරනු ලැබීය.

කෘෂිකර්ම සංවර්ධනය සඳහා වූ ජාත්‍යන්තර අරමුදලේ (IFAD) මූල්‍යයනයෙන් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන සඳහා නිලධාරීන් බඳවා ගැනීම, සේවා දීර්ඝ කිරීම, වැටුප් වර්ධක ලබාදීම හා එම නිලධාරීන්ගේ පෞද්ගලික ලිපි ගොනු පවත්වාගෙන යාම ද පාලන අංශය මගින් සිදුකරනු ලැබීය.

### V. ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු

කාර්යක්ෂම මහජන සේවාවක් හා ප්‍රියමනාප කාර්යාල පරිශ්‍රයක් ඇති කිරීම සඳහා අමාත්‍යාංශයේ ඵලදායිතා ප්‍රවර්ධන කටයුතු අඛණ්ඩව සිදු කරනු ලැබීය. සේවක ගැටළු

අවම කිරීම, කණ්ඩායම් හැඟීම් වර්ධනය කිරීම හා සුහදශීලිත්වය වර්ධනය කර ගැනීම යන අරමුණු පෙරදැරි කර ගෙන තත්ත්ව කව පිහිටුවා ඇත. ඵලදායිතා සංකල්පය කාර්ය මණ්ඩලය තුළ ස්ථාපිත කිරිම සඳහා නිලධාරින් දැනුවත් කිරීමේ කටයුතු හා පුහුණු වැඩසටහන් වලට යොමු කිරීම සිදුකර ඇත. ඵලදායිතා සංකල්පය කාර්යාලයේ සිට නිවස දක්වා ගෙන යාම අරමුණු කර ගෙන " අලුත් සර් " වාර්තා රංගය (ඩොකියුඩ්‍රාමාව) ද මෙම වර්ෂයේදී ප්‍රදර්ශනය කරන ලදි. එසේම ජාතික ඵලදායිතා තරගයට ඉදිරිපත්ව, අමාත්‍යාංශය ඇතුළත ඵලදායි වෙනස්කම් රාශියයක් ද සිදු කරන ලදී.

## 4.2 ගිණුම් අංශය

I. 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය ඇමුණුම 1 හි දැක්වේ. මූල්‍ය ප්‍රගතිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 82 කි. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්ට සම්පූර්ණ ඇස්තමේන්තු ගත මුදල් භාණ්ඩාගාරයෙන් ලබා ගැනීමේදී මුහුණදීමට සිදු වූ සීමාකාරී සාධකයන් මත මූල්‍ය ප්‍රගතිය සියයට 100 කින් ළගාකර ගැනීමට අසීරු විය.

II. 2012 වර්ෂය තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ අනුමත සීමාවන් තුළ පිහිටා අමාත්‍යාංශයේ නිලධාරීන්ට ණය සහ අත්තිකාරම් ලෙස රුපියල් මිලියන 4.5 ක් ලබාදී ඇත.

III. භාණ්ඩාගාරයෙන් ඉල්ලා සිටි අක් මුදල් අපේක්ෂිත පරිදි සම්පූර්ණයෙන් නොලැබීම හේතුවෙන් 2012 ප්‍රසම්පාදන සැලැස්මට අනුව සමහර මිලදිගැනීම් සිදු කිරීමට නොහැකි වුවද, වර්ෂය සඳහා අත්‍යාවශ්‍ය වූ භාණ්ඩ පමණක් ප්‍රමුඛතා පදනම යටතේ මිලදී ගැනීමට හැකිවිය.

IV. 2011 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පසු විපරම් කටයුතු නිම කරන ලදී. 2012.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ කටයුතු නිමකර, 2012.03.28 දිනය වන විට සමීක්ෂණ මණ්ඩල වාර්තා ඉදිරිපත් කරනු ලැබ ඇත.

V. 2012 වර්ෂය තුළ අමාත්‍යාංශයේ කටයුතු සම්බන්ධයෙන් ලැබී තිබූ විගණන විමසුම් 12 ටම පිළිතුරු යවා ඇත. අමාත්‍යාංශය යටතේ ඇති කුඩා වැව්ලි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘතියේ 2010 වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තා ලබාගෙන අවශ්‍ය කටයුතු සඳහා IFAD ආයතනය වෙත යොමුකර ඇත.

VI. 2012 විසර්ජන ගිණුම සහ ර.නි.අ.බී.ගිණුම 2011.03.28 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කරනු ලැබ ඇත.

## 4.3 අභ්‍යන්තර විගණන අංශය

<u>අභ්‍යන්තර විගණන අංශයේ කාර්යයන්</u>

I. අමාත්‍යාංශයේ සෑම අංශයකම ( ව්‍යාපෘති ද ඇතුළුව ) ආයතන හා ගිණුම් කටයුතු විගණනය කිරීම හා වාර්තා කිරීම.

II. වැරදි හා වංචා වැළැක්වීම සඳහා අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වන පාලන ක්‍රම සැලැස්ම අතින් මෙන්ම ක්‍රියාකාරිත්වය අතින් ද සාර්ථකදැයි සොයා බැලීම හා ඒ පිළිබඳ නිරීක්ෂණ හා යෝජනා ඉදිරිපත් කිරීම

III. ගිණුම් හා වෙනත් වාර්තාවල විශ්වසනීයභාවය විනිශ්චය කිරීම හා අමාත්‍යාංශයේ වත්කම් සියළුම ආකාරයේ අලාභහානිවලින් උපරිම වශයෙන් ආරක්ෂා කර ඇත්දැයි යන්න සොයා බැලීම හා වාර්තා කිරීම.

IV. කළුබෝවිටියාන තේ කම්හල් සමාගම, ජාතික වැවිලි කළමනාකරණ ආයතනය හා තුරුසවිය අරමුදලෙහි කටයුතු විගණනය කිරිම හා වාර්තා කිරීම.

V. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල පහත සඳහන් කටයුතු සම්බන්ධව ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා මාස තුනකට (03) වරක් විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පැවැත්වීම.

- අ. අභ්‍යන්තර විගණන අංශවල කටයුතු
- ආ. විගණකාධිපති විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම් / වාර්තා සඳහා පිළිතුරු සැපයීම
- ඇ. එක් එක් ආයතනවල විගණන හා කළමනාකරණ කමිටු රුැස්වීම් පැවැත්වීම.
- ඈ. වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම ක්‍රියාත්මක කිරීම.
- ඉ. පාලන වාර්තා / වාර්ෂික වාර්තා සකස් කිරීම.
- ඊ. වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම.
- උ. එක් එක් ආයතනවල වෙනත් මූල්‍ය කටයුතු සහ පරිපාලන කටයුතු

VI. අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන ආයතනවල වැඩ සැලසුම්වලට අනුකූලව ක්‍රියාත්මකවීම ප්‍රමාදවීමට තුඩුදෙන ගැටළු ක්ෂේත්‍රයන් පිළිබඳ විමර්ශනය කිරීම හා වාර්තා කිරීම.

VII. අවශ්‍ය අවස්ථාවලදී අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල කටයුතු සම්බන්ධයෙන් විශේෂ විමර්ශන කටයුතු සිදු කිරීම හා වාර්තා කිරීම.

<u>අභ්‍යන්තර විගණන අංශයේ කටයුතුවල ප්‍රගතිය</u>

I. අමාත්‍යාංශය යටතේ ඇති කුඩා වැවිලි ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහනට අයත් මොණරාගල උපකාර්යාලයේ කටයුතු සම්බන්ධයෙන් විගණන කටයුතු සිදුකර ඇති අතර, එහිදී අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කරවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

II. (අ) කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමට අයත් කළුබෝවිටියාන තේ කම්හලේ තේ විකිණීම සම්බන්ධව විගණන පරීක්ෂාවක් සිදුකරන ලද අතර, ඒ අනුව අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කරවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ආ) ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ආයතනික කටයුතු හා වාහන නඩත්තුව සම්බන්ධයෙන් විගණන පරීක්ෂණයන් සිදුරක ඇති අතර, ඒ අනුව අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කරවීම සඳහා අවශ්‍ය පියවර ගෙන ඇත.

(ඇ) තුරුසවිය අරමුදල මගින් තුරුසවිය සමිති වෙත සහනාධාර ගෙවීම සම්බන්ධව විගණන පරීක්ෂණයක් සිදුකරන ලද අතර, එහිදී අනාවරණය වූ අඩුපාඩු නිවැරදි කරවීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

III. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවල 4.3 (V) ඡේදයේ සඳහන් කාර්යයන් සම්බන්ධයෙන් ප්‍රගති සමාලෝචන කිරීම සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් තුනක් (03) පවත්වා ඇති අතර, එහිදී ආයතන සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ ක්‍රියාත්මකවේද යන්න පිළිබඳව පසු විපරම් කිරීමේ කටයුතු ද නිරන්තරයෙන් සිදුකරනු ලැබීය.

IV. අමාත්‍යාංශ ගබඩාවේ තැන්පත් කර ඇති භාණ්ඩ හා අනෙකුත් අංශවල භාණ්ඩවල ආරක්ෂාව පිළිබඳ අධ්‍යනය කර, ඒවායේ ආරක්ෂාව තහවුරු කිරීම සඳහා ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳව නිර්දේශ ඇතුළත් වාර්තාවක් ඉදිරිපත් කරන ලද අතර, එහි සඳහන් නිර්දේශයන් මේවන විට අමාත්‍යාංශය තුළ ක්‍රියාත්මක වෙමින් පවතී.

V. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ ශක්ති අරමුදල, කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම යන ආයතනවල කටයුතු සම්බන්ධව ලද පැමිණිලි අනුව විශේෂ පරීක්ෂණ සිදුකර අදාළ වාර්තා බාර දී ඇත.

## 4. 4 සංවර්ධන අංශය

2012 වර්ෂයේදී සංවර්ධන අංශය මගින් තේ සහ රබර් වගාවන් සංවර්ධනය සඳහා ද, එම වගාවන් ආශ්‍රිත කර්මාන්ත සහ අගය එකතු කළ නිෂ්පාදනයන් සංවර්ධනය සඳහා ද පහත පියවර ගනු ලැබීය.

I. වසර 140 කට අධික වැවිලි කර්මාන්ත ඉතිහාසයේ ප්‍රථම වරට ජාතික වැවිලි සම්මාන උළෙලක් 2012 වසරේදී අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වීම. මෙම උළෙල සඳහා තරග සංවිධානය, මෙහෙයවීම, උත්සව සංවිධානය යන කටයුතු සම්බන්ධීකරණය මූලික වශයෙන් සංවර්ධන අංශය මගින් ඉටුකරන ලදි.

II. 2012.10.06 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතනවල පනත් නූතන අවශ්‍යතාවයන්ට සරිලන පරිදි වෙනස් කිරීමට කටයුතු තවදුරටත් සිදුකිරීම. මේ සම්බන්ධව අමාත්‍ය මණ්ඩලය විසින් අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් හා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය, තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යාංශය, කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය සහ මහ බැංකුවේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පිහිටුවා ඇති කමිටු කැඳවීම, තීරණ ක්‍රියාත්මක කිරීම සහ පහසුකම් සැලසීම් කටයුතු සිදු කිරිම. ඒ අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය, තේ පර්යේෂණ ආයතනය සහ තේ ශක්ති අරමුදල යන ආයතනවල පනත් සම්බන්ධයෙන් සිදුකළයුතු සංශෝධන අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම ද සෙසු ආයතනවල සංශෝධන සම්බන්ධව අවසන් කමිටු නිර්දේශ ලබා ගැනීමටද කටයුතු කරන ලදි.

III. අන්තර් ජාතික කෘෂිකර්ම සංවර්ධන අරමුදලේ ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන කුඩා වැවිලිකරුවන්ගේ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන සම්බන්ධ ප්‍රතිපත්ති සැකසීම, මෙහෙයවීම හා සම්බන්ධීකරණ කටයුතු සිදුකිරීම.

IV. 2012 පෙබරවාරි මස අනුරාධපුර ඔයාමඩුවේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයට අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතන සමග සහභාගී වීම.

V. ආයතන මගින් සිදුකරන පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ප්‍රතිපත්තිමය මාර්ගෝපදේශ සැපයීම ද ඒ සම්බන්ධයෙන් ඇතිවන ගැටළු සහගත තත්ත්වයන්ට විසඳුම් ලබාදීමට ද කටයුතු කිරීම.

VI. මුදල් කොමිෂන් සභාවේ සහ පළාත් සභාවල සහයෝගය සහිතව 2012 වසරේ ක්‍රියාත්මක කළ වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රවේශ මාර්ග සංවර්ධනය කිරීමේ වැඩසටහනට අවශ්‍ය මුලික වැඩකටයුතු සංවිධානය කිරීම සහ අදාළ තීරණ ගැනීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැපයීම.

VII. වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය යටතේ පවතින සියලු ආයතනවල සහ විදේශ ආධාර මත ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්හි ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ ඉහළ කාර්යසාධන මට්ටමක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගැනීම.

VIII. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම.

IX. තේ හා රබර් සම්බන්ධ අන්තර්ජාතික සංවිධාන සමග සම්බන්ධීකරණ කටයුතු සහ ඇති කරගනු ලබන එකඟතා ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය කිරීම.

X. දේශගුණික විපර්යාස හේතුවෙන් වැවිලි ක්ෂේත්‍රයට සිදුවන බලපෑම පිළිබඳ කටයුතු කිරීම.

XI. අමාත්‍යාංශයේ සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් ජනමාධ්‍යවලට තොරතුරු සැපයීම සහ තොරතුරු හුවමාරු කිරීමේ කටයුතු

XII. දේශීය හා විදේශීය වෙළෙඳපොළවල තේ අලෙවිකරණය හා ප්‍රවර්ධනය සඳහා තේ අපනයනකරුවන්ගේ දායකත්වයෙන් රුපියල් බිලියන 5 ක අරමුදලක් ඇරඹීම සම්බන්ධ අවශ්‍ය කටයුතු සිදුකිරීම

XIII. තේ ක්ෂේත්‍රයේ පාර්ශ්වකරුවන් සමග අඛණ්ඩ සම්බන්ධීකරණය තුළින් සංවාදශීලිව කටයුතු සිදුකිරීම.

XIV. තේ ක්ෂේත්‍රයේ රෝපණ ද්‍රව්‍ය සහ පොහොර මිශ්‍රණ සම්බන්ධ විශේෂ කමිටුවක් පත්කර ගැටළු නිරාකරණය කිරීම.

XV. තේ නැවත වගාව සහ නව වගාව සඳහා ලබාදෙන සහනාධාර වැඩිකිරීමට අදාළ රෙගුලාසි පැනවීමේ කටයුතු සිදුකිරීම.

XVI. ගරු අමාත්‍යතුමා අදාළ සියළුම ආයතනයන්හි ප්‍රධාන නිලධාරීන් සමග දිස්ත්‍රික්/ කලාප මට්ටමින් තේ කර්මාන්තයේ නිරත ගොවීන් හා පාර්ශවකරුවන් හමුවී

ඔවුන්ගේ ගැටළු විසඳීම සහ අදහස් හා යෝජනා ලබා ගෙන ඒ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම.

XVII. සාම්ප්‍රදායික නොවන ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත කිරීමට විශේෂ පියවර ගැනීම. මේ යටතේ අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක රබර් වගා කිරීමේ වැඩසටහන ඇරඹීම 2012 වසරේදී සිදුවූ අතර, ඊට අදාළ ප්‍රතිපත්ති සැකසීම, විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සහ ප්‍රගතිය සමාලෝචනය සිදුකිරීම.

XVIII. උතුරු ප්‍රදේශයේ රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා මෙහෙයුම් කමිටුවක් පත්කර විවිධ ආයතන අතර සම්බන්ධීකරණය සහ ප්‍රතිපත්ති සැකසීම.

XIX. රබර් අංශයේ තවාන් සංවර්ධනය සහ පැළවල ගුණාත්මය වර්ධනය කිරීම සඳහා විශේෂ වැඩසටහනක් ඇරඹීම සහ තවාන්වල ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කිරීම.

XX. රබර් වගාව සම්බන්ධ පාර්ශවකරුවන් සමග සම්බන්ධීකරණය.

XXI. රබර් නව වගාව සහ නැවත වගාව සඳහා ලබාදෙන සහනාධාර වැඩිකිරීමට අදාළ රෙගුලාසි පැනවීමට අදාළ කටයුතු ඉටු කිරීම.

XXII. 2012 අයවැය යෝජනාවලට අනුව අම්පාර දිස්ත්‍රික්කයේ හෙක්ටයාර 10,000 ක අලුතින් රබර් වගාව ව්‍යාප්ත කිරීමට අවශ්‍ය ඉඩම් හඳුනා ගැනීම, ව්‍යාප්ති කටයුතු හා වගා කටයුතු ඇරඹීම සඳහා මූලික කටයුතු සංවිධානය කිරීම.

XXIII. ස්වභාවික රබර් නිපදවන රටවල සංගමයේ රැස්වීම් (ANRPC), ජාත්‍යන්තර රබර් අධ්‍යයන කණ්ඩායම් (IRSG) සමුළුවලට සහභාගි වෙමින් ශ්‍රී ලංකාව නියෝජනය කිරීම.

## 4.5 සැලසුම් අංශය

2012 වර්ෂයේදී සැලසුම් අංශය මගින් ඉටුකරන ලද ප්‍රධාන කාර්යයන්හි සාරාංශය පහත පරිදි වේ.

I. 2012 වර්ෂයට අදාළව අමාත්‍යාංශයේ ක්‍රියාත්මක සැලැස්ම සකස් කර මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යාංශයට සහ අදාළ ආයතන වෙත ඉදිරිපත් කිරීම.

II. අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයන්හි වර්ෂයේ එක් එක් කාර්තුවට අදාළ ප්‍රගති වාර්තා සකස්කර ඉදිරිපත් කිරීම.

III. ගරු අමාත්‍යතුමා විසින් පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් 03 ට අදාළව ආයතනික මට්ටමින් ගනුලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ නිලධාරීන් වෙත යොමු කිරීම හා එහි ප්‍රගති විශ්ලේෂණයට අදාළ වාර්තා සකස් කිරීම හා සාකච්ඡා සංවිධානය කිරීම.

IV. 2012 වර්ෂයේදී එක් එක් ආයතන විසින් ඉදිරිපත් කරන ලද ව්‍යාපෘති යෝජනා 15 ක් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම.

V. 2012 නොවැම්බර් 23 පවත්වන ලද වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අයවැය සාකච්ජාවට අදාළ ප්‍රගති වාර්තාව - 2012 සකස් කර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම.

VI. ශ්‍රී ලංකා මහ බැංකුවේ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා - 2012 සහ ශ්‍රී ලංකා මහ බැංකු වාර්ෂික වාර්තාව - 2012 ට අදාළව වැවිලි ක්ෂේත්‍රයේ ප්‍රගතීන් නියමිත ආකෘතින්ට අනුව සකසා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීම.

VII. අමාත්‍යාංශය යටතේ පවත්නා ආයතනයන්හි පස් අවුරුදු සැලැස්ම යාවත්කාලීන කිරීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය කිරීම.

VIII. අතිගරු ජනාධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම් සඳහා අදාළ තොරතුරු ලබාදීම.

IX. ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක කරනු ලබන දිවිනැගුම ජාතික සංවර්ධන වැඩසටහන යටතේ රුපියල් මිලියන 28 ක වැය දරා තේ හා රබර් ක්ෂේත්‍රවලට අදාළ වැඩසටහන ක්‍රියාත්මක කිරීම.

X. 2011 වර්ෂයේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව සකස් කර අමාත්‍ය මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීම.

XI. රුපියල් මිලියන 3 ක ප්‍රතිපාදන තුළින් භූගෝලීය තොරතුරු තාක්ෂණය උපයෝගී කර ගනිමින් තේ හා රබර් ඉඩම් සිතියම්ගත කිරීම සඳහා වූ නියාමක ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කයේ ආරම්භ කිරීමට අදාළ කටයුතු සම්බන්ධීකරණය කිරීම.

## 4.6 වැවිලි කළමනාකරණ අධීක්ෂණ අංශය

ජනතා වතු සංවර්ධන මණ්ඩලය (ජනවසම) හා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව (ශ්‍රී.ලං.රා.වැ.ස.) යටතේ පාලනය වූ විශාල ප්‍රමාණයේ වතු 439 ක් 1992 දී ප්‍රාදේශීය වැවිලි සමාගම් 23 ක් යටතට පවරා පුද්ගලීකරණය කරන ලදී. මෙම වතුවල ඇති ඉඩම්වල අයිතිය තවමත් ජනවසම හා ශ්‍රී.ලං.රා.වැ.ස. යටතේ පවතින අතර වතුවල පාලනය හා වගාවන් අවුරුදු 53 ක බදු පදනම මත ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙත ලබා දී ඇත. මෙම සමාගම්වල ස්වර්ණමය කොටස්කරු වශයෙන් භාණ්ඩාගාරයේ ලේකම් වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීම මෙම අංශයේ කාර්යභාරය වේ.

<u>වැවිලි කළමනාකරණ අධික්ෂණ අංශයේ කාර්ය සාධනය - 2012</u>

I. **ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වගා කළ හැකි එහෙත් වගා නොකළ ඉඩම් හඳුනා ගැනීම.**

(අ) 2011 වර්ෂය තුළදී ප්‍රාදේශීය වැවිලි සමාගම් 20 ක වගා කළ හැකි මට්ටමේ පවතින එහෙත් වගා නොකළ ඉඩම් පිළිබඳ සමීක්ෂණයෙන් පසුව 2012 වර්ෂය මුලදී නැවත වරක් ක්ෂේත්‍ර සමීක්ෂණයක් සිදුකළ අතර, එහි අවසන් වාර්තාව 2012.08.31 දින පිළියෙළ කර අදාළ ආයතන වෙත අවශ්‍ය කටයුතු සඳහා යොමුකර ඇත.

(ආ) ජනාධිපති ලේකම් කාර්යාලයේ උපදෙස් අනුව, හඳුනාගත් ඉඩම් බෙදාදීම සඳහා විධිමත් යාන්ත්‍රණයක් පිළියෙල කිරීමට අදාළව වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් අමාත්‍යාංශවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සහ වගා ඉඩම් පවතින දිස්ත්‍රික්කවල දිසා ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කරන ලද අතර, එම කමිටුව විසින් පිළියෙල කරන ලද වාර්තාව 2012.07.05 දින ජනාධිපති ලේකම් කාර්යාලය වෙත භාරදී ඇත. මෙම ඉඩම් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ බෙදා දීමට යෝජිතය.

II. **ප්‍රාදේශීය වැවිලි සමාගම් වෙතින් බදු කුලී අය කිරීම.**

(අ) 2012 වර්ෂය තුළදී එකතු කිරීමට ඇස්තමේන්තු කර ඇති බදු කුලී මුදල රුපියල් මිලියන 928 ක් වන අතර, එම මුදලින් රුපියල් මිලියන 771 ක් 2012.12 .31 දින වන විට අයකර ගෙන ඇත.

(ආ) 2012. 01. 01 දිනට පෙර වර්ෂ වෙනුවෙන් අය කර ගැනීමට තිබූ හිඟ බදු කුලී මුදල රුපියල් මිලියන 376 ක් වූ අතර, 2012.12.31 දින වන විට එයින් රුපියල් මිලියන 289 ක් අය කර ගෙන ඇත.

III. **ප්‍රාදේශීය වැවිලි සමාගම්වල මූල්‍ය ප්‍රගතිය සමාලෝචනය.**

ප්‍රාදේශීය වැවිලි සමාගම්වල කාර්තුමය හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන නිසිලෙස අධ්‍යයනය කිරීමත් විශ්ලේෂණය කිරීමත් එමගින් අවශ්‍ය තැන් නිවැරදි කිරීමට සමාගම්වලට උපදෙස් දීමත් සිදුකරනු ලබන අතර, මෙය අඛණ්ඩව සහ ක්‍රමවත්ම කිරීමට කටයුතු යොදා ඇත. තවද, වැවිලි සමාගම්වල මූල්‍ය සහ භෞතික ප්‍රගතිය සම්බන්ධයෙන් වූ තොරතුරු පද්ධතික් පවත්වාගෙන යනු ලබන අතර, අවශ්‍ය තොරතුරු අදාළ අංශ වෙත ලබා දීමටද කටයුතු කර ඇත.

IV. **අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවල සහභාගීත්වයද ඇතිව වැවිලි සමාගම් මගින් පාලනය වන වතුවල දැව හෙළීම් සඳහා අවශ්‍ය අනුමැතිය ලබා දීම.**

2012 වර්ෂය තුළ වැවිලි සමාගම් 10 ක් යටතේ පාලනය වන වතු 61 ක දැව හෙළීම් සම්බන්ධයෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ හා අවශ්‍ය අනෙකුත් කටයුතු සිදු කර ඇත. මෙයට අමතරව, වෙනත් විවිධ අවස්ථාවලට අදාළව ( උදා: ජීවිත හා අනෙකුත් දේපළවලට අනතුරුදායක ගස්, අධිබලැති විදුලි රැහැන් ස්ථාපනය කිරීම සඳහා ඉවත් කළයුතු ගස්, නිවාස හා ව්‍යාපෘති, ක්‍රීඩා පිටි වැනි අනෙකුත් මහජන අවශ්‍යතා ඉටු කිරීම සඳහා ඉවත් කළයුතු ගස්, බෝග විවිධාංගීකරණය සඳහා අවශ්‍ය වන අවස්ථාවලදී ඉවත් කළ යුතු ගස් හා වගාවට සෙවන ලබා දෙන අනවශ්‍ය ගස් ) ගස් ඉවත් කිරීම සඳහා අවශ්‍ය අනුමැතීන් ලබා දීම ද කර ඇත.

V. **රජයේ සංවර්ධන කටයුතු හා අනෙකුත් පොදු කටයුතු සඳහා ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතු ඉඩම් නිදහස් කිරීමට අවශ්‍ය වන අවස්ථාවලදී ඒ සම්බන්ධයෙන් වැවිලි සමාගම් වල එකඟතාවය මත ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමැතිය ලබා ගැනීමට අදාළ කටයුතු සිදුකිරීම හා අවශ්‍ය අවස්ථා වලදී අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණයන් සිදු කිරීම.**

2012 වර්ෂය තුළදී අධිවේගී මාර්ග, කාර්මික ජනපද, ජල පහසුකම් සැපයීම හා අනෙකුත් යටිතල පහසුකම් සංවර්ධනය වැනි කටයුතු සඳහා වතු ඉඩම් ලබා ගැනීම සම්බන්ධයෙන් වූ ඉල්ලීම් 65 ක් පමණ මෙම අංශය වෙත ලැබී ඒ සම්බන්ධව කටයුතු කර ඇති අතර, නිවාස ව්‍යාපෘති 30 ක් , පාසැල් 20 ක්, වතු රෝහල් 03 ක් , ආගමික ස්ථාන 40 ක්, සුසාන භූමි 25 ක්, ක්‍රීඩා පිටි හා අනෙකුත් සුභ සාධන කටයුතු වෙනුවෙන් වූ ඉල්ලීම් 75 ක් සම්බන්ධයෙන් ද කටයුතු කර ඇත. මෙයට අමතරව, පොදු කටයුතු සඳහා ඉඩම් නිදහස් කිරීම සම්බන්ධයෙන් අධිකරණයෙහි විභාග වන නඩුවලට අදාළ ක්ෂේත්‍ර පරීක්ෂණ 06 ක් සිදුකර ඇත.

**VI. රජය සතු ඉඩම්වල සන්තකය ආපසු රජය වෙත ලබා ගැනීමට අදාළව 1979 අංක 7 දරණ රජයේ ඉඩම් ( සන්තකය ආපසු ලබා ගැනීමේ ) පනතෙහි විධි විධාන අනුව වැවිලි සමාගම් 23 මගින් පාලනය වන වතු ඉඩම්වල අනවසර පදිංචිකරුවන් හා අනවසර ඉදිකිරීම් සම්බන්ධයෙන් කටයුතු කිරීම.**

2012 වර්ෂය තුළ වැවිලි සමාගම් 23 මගින් පාලනය වනු ලබන වතුවල මෙවැනි අවස්ථා 1,100 කට අදාළව මෙම අංශය විසින් කටයුතු සිදුකර ඇත.

**VII. රජය හා ප්‍රාදේශීය වැවිලි සමාගම් අතර පවතින බදු ගිවිසුමෙහි 4 (අ) සඳහන් කොන්දේසි වලට අනුව එකී ඉඩම් තුන්වන පාර්ශවයක් වෙත, රටෙහි සංවර්ධනය අරමුණු කරගත් විවිධ කාර්යයන් සඳහා (උදා: විදුලි සංදේශ කුළුණු ඉදි කිරීම හා කුඩා පරිමාණ ජල විදුලි බලාගාර ඉදිකිරීම) උපබදු පදනම මත ලබා දීමේ හැකියාව වැවිලි සමාගම් සතුව පවතී. මෙම කටයුතු අනුමත කරනු ලැබූ නිශ්චිත ක්‍රියාපටිපාටියකට අනුව සිදුකිරීම.**

ඒ අනුව ඉඩම් කොටස් 12 ක් සම්බන්ධයෙන් ස්වර්ණමය කොටස් හිමිකරුගේ අනුමැතිය ලබා ගෙන ඇති අතර, තවත් මෙවැනි ඉල්ලීම් 23 ක් සම්බන්ධයෙන් කටයුතු කරමින් පවතී.

**VIII. ප්‍රාදේශීය වැවිලි සමාගම් මගින් පාලනය වන වතු හා තේ කර්මාන්තශාලාවල ක්‍රියාකාරිත්වය හා ඒවායෙහි ප්‍රගතිය අධීක්ෂණය කිරීම සඳහා මෙන්ම, වතු ඉඩම්වල අනවසර පදිංචි වීම් සම්බන්ධයෙන් අධිකරණයෙහි විභාග වන නඩුවලට අදාළව ක්ෂේත්‍ර පරීක්ෂණ 15 ක් පමණ සිදු කිරීම.**

**IX.** මැනුම්පති දෙපාර්තමේන්තුව හා ප්‍රාදේශීය වැව්ලි සමාගම් වල සහභාගිත්වය ඇතුව සිදු කිරීමට නියමිත වතු ඉඩම්වල කැඩස්තර මිනුම් කටයුතු නැවත ආරම්භ කිරීම වෙනුවෙන් අදාළ ප්‍රතිපාදන 2013 අයවැය මගින් ලබා ගැනීමට කටයුතු කිරීම.

**X.** අතිගරු ජනාධිපතිතුමන් හා ගරු වැව්ලි කර්මාන්ත අමාත්‍යතුමන් වෙත වතු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් මහජනතාව විසින් කරනු ලබන විවිධ පැමිණිලි හා ඉල්ලීම් 775 ක පමණ ප්‍රමාණයක් සම්බන්ධයෙන් වැව්ලි සමාගම්වල සහයෝගීතාවයද ඇතිව අවශ්‍ය කටයුතු සිදුකිරීම.

**XI.** ගරු වැව්ලි කර්මාන්ත අමාත්‍යතුමන් ගේ මූලිකත්වයෙන් පැවති ස්වර්ණමය කොටස් හිමිකරුගේ රැස්වීමේදී තීරණය වු පරිදි තේ කර්මාන්තය සඳහා වූ නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ ප්‍රධානත්වයෙන් යුත් කමිටුවක් පත් කර ඒ මගීන් කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දිගු කාලීන ක්‍රමෝපායන් සම්බන්ධ තීරණ ගැනීම සම්බන්ධව ක්‍රියා කිරීම.

**XII.** ගරු වැව්ලි කර්මාන්ත අමාත්‍යතුමන් ගේ ප්‍රධානත්වයෙන් ප්‍රාදේශීය වැව්ලි සමාගම්, වැව්ලිකරුවන්ගේ සංගමය හා අනෙකුත් අදාළ රාජ්‍ය ආයතනවල සහභාගීත්වයද සහිතව මසකට වරක් පවත්වනු ලබන ස්වර්ණමය කොටස් හිමිකරුවන්ගේ රැස්වීම් වලදී වතු කේෂේත්‍රයෙහි කෙටි කාලීනව හා දීර්ඝ කාලීනව පැන නැගී ඇති ආර්ථික, පාරිසරික හා සමාජයීය ගැටළු හා ඒ සඳහා ගත හැකි ප්‍රායෝගික විසඳුම් පිළිබඳව සාකච්ඡා කිරීම. විශේෂයෙන්ම, අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වනු ලැබූ දිස්ත්‍රික් සංවර්ධන කමිටු රැස්වීම්වලදී වතු ක්ෂේත්‍රය සම්බන්ධයෙන් සාකච්ඡාවට බඳුන් වූ කරුණු කෙරෙහි මෙම අංශය විසින් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියා මාර්ගයන් ගැනීම.

## 4. 7 තේ, රබර් සහ පොල් වතු ( කැබලි කිරීමේ පාලන ) මණ්ඩලය

1958 වසරේදී තේ සහ රබර් වතු කැබලිකරණය පාලනය කිරීමේ පාලන පනත පාර්ලිමේන්තුවේදී සම්මත කරනු ලැබුවද, පොල් වතු කැබලිකරණය පාලනය කිරීම සඳහා විධිවිධාන නොපැවතුණි. එහි ප්‍රතිඵලයක් ලෙස පොල් වතු හිමියන් සහ ඉඩම් අලෙවි නියෝජිතයන් විසින් කිසිදු පාලනයකින් තොරව විශාල ප්‍රමාණයේ පොල් වතු කැබලි කිරීම සහ අලෙවි කිරීම සිදු කරන ලද අතර , එය පොල් නිෂ්පාදනයේ සහ පොල් ආශ්‍රිත නිෂ්පාදනයේ පහත වැටීමකට හේතු විය. තව ද, මෙම තත්ත්වය හේතු කොටගෙන විවිධ පාරිසරික සහ සමාජයීය ගැටළු පැනනැගී ඇත.

මෙම කරුණු සැලකිල්ලට ගනිමින්, 2005 අංක 20 දරණ කැබලිකරණය පාලනය කිරීමේ පනත මගින් 1958 අංක 02 දරණ කැබලිකරණය පාලනය කිරීමේ පනත සංශෝධනය කරන ලදී. මෙම පනතේ විධිවිධාන යටතේ හෙක්ටයාර 20 ට වැඩි තේ සහ රබර් වතුවල සහ හෙක්ටයාර 04 ට වැඩි පොල්වතුවල අයිතිය පැවරීම, විකිණීම, ත්‍යාග කිරීම හෝ හුවමාරුව සඳහා කැබලිකරණ පාලන මණ්ඩලයේ අනුමැතිය ලබාගත යුතුය. මෙකී වතු පැවරීම සඳහා අනුමැතිය ලබාදීමේ බලය අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.

තනි ඒකක වශයෙන් ඉඩම් පැවරීමේදී ඉඩම් කැබලිවීමක් සිදු නොවුවත් පනතේ විධිවිධාන යටතේ මණ්ඩලයෙන් අවසර ලබාගත යුතු බැවින්, මහජනතාවට අත්විදීමට සිදුවන දුෂ්කරතා අවම කිරීමටත්, ප්‍රමාදයකින් තොරව ඉඩම් පැවරීමේ අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මෙම පනතේ 8 (1) (බී) වගන්තිය මගින් දක්වා ඇති විධිවිධාන එම පනතේ 3 හා 5 වගන්ති හා 8 (1) (ඒ) වගන්තිය යටතේ බලපෑමක් ඇති නොවන සේ සලකා එම වගන්ති සංශෝධනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්, මෙවන විට පොල් ඉඩම් සම්බන්ධයෙන් පනවා ඇති අක්කර 9 රූඩ් 3 පර්චස් 21.44 ක සීමාව අක්කර 5 දක්වා අඩු කිරීම සඳහා නීති කෙටුම්පත් සම්පාදක සමග සාකච්ඡා කරමින් පවතී.

**<u>තේ, රබර් සහ පොල් වතු (කැබලි කිරීමේ පාලන) මණ්ඩලයේ 2012 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා ප්‍රගතිය</u>**

I. 2012 ජනවාරි මස සිට දෙසැම්බර් දක්වා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත.

II. 2012 වර්ෂයේ තේ, රබර් සහ පොල් වතු ( කැබලි කිරීමේ පාලන) මණ්ඩලය වෙත ලැබුණු අයදුම්පත් පිළිබඳ තොරතුරු

| දිස්ත්‍රික්කය | අයදුම්පත් සංඛ්‍යාව |
|---|---|
| කුරුණෑගල | 204 |
| පුත්තලම | 186 |
| ගම්පහ | 98 |
| අනෙකුත් | 78 |
| **මුළු අයදුම්පත් ප්‍රමාණය** | **566** |

III. 2012 වර්ෂය තුළ පහත සඳහන් පරිදි පැවරීම් කිරීමට අනුමැතිය ලබා දී ඇත.

| | |
|---|---|
| තනි ඒකක ලෙස පැවරීම් සඳහා ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 110 |
| වෙනත් පැවරීම් ලෙස ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 411 |
| බැංකු උකස් සඳහා අනුමැතියට ඉදිරිපත් කළ අයදුම්පත් සංඛ්‍යාව | 25 |
| ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව | 20 |
| 2012 වර්ෂයේ ලැබුණු අයදුම්පත් ප්‍රමාණය | 566 |
| පසුගිය වසරේ අයදුම්පත්වල තිබූ අඩු පාඩු හේතුවෙන් අනුමැතියට ඉදිරිපත් නොකළ අයදුම්පත් | 133 |
| **අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන ලද මුළු අයදුම්පත් ප්‍රමාණය** | **699** |

ඇමුණුම 1

## 2012 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

### 1. වියදම් ඇස්තමේන්තුව :

රු '000

| | 135 -1-1 අමාත්‍ය කාර්යාලය | | 135-1-2 පරිපාලන සහ ආයතනික සේවා | | 135-2-3 වැව්ලි සංවර්ධන වැඩසටහන් | | 135-2-4 වැව්ලි සංවර්ධන ආයතන | | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|
| | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | පුනරාවර්තන | ප්‍රාග්ධන | |
| 1.ඇස්තමේන්තු ප්‍රතිපාදනය | 53,750 | 8,350 | 55,345 | 12,200 | 32,700 | 547,750 | 814,992 | 505,700 | 2,030,787 |
| 2.මු.රෙ.66 යටතේ මාරුකිරීම් සහ පරිපූරක ප්‍රතිපාදන | 1,011 | 9,555 | (0,066) | 0 | 1,000 | 3,000 | 0 | 0 | 11,500 |
| අයවැය චක්‍රලේඛ අංක 155 අනුව ප්‍රතිපාදන ඉතිරිකිරීම් | 737 | 752 | 648 | 1,098 | 275 | 14,058 | 12,622 | 28,890 | 59,080 |
| 3.ශුද්ධ ප්‍රතිපාදනය | 54,024 | 17,153 | 51,631 | 11,102 | 33,425 | 536,692 | 802,370 | 476,810 | 1,983,207 |
| 4.වියදම | 53,835 | 13,044 | 48,219 | 4,904 | 30,621 | 377,947 | 773,979 | 328,313 | 1,630,862 |
| 5.වියදමෙ ප්‍රතිශතය | 100% | 76% | 93% | 44% | 92% | 69% | 96% | 69% | 82% |

**මෙම වියදම් සඳහා මූල්‍යකරණය පහත සඳහන් පරිදි සිදු වී ඇත.**

රු '000

| වියදම් මූල්‍යකරණය | වියදම |
|---|---|
| 11 - දේශීය අරමුදල් | 1,258,957 |
| 12 - විදේශීය ණය | 346,865 |
| 17 - විදේශාධාර සබැදි දේශීය අරමුදල් | 25,040 |
| **එකතුව** | **1,630,862** |

### 2.ආදායම් - ප්‍රාදේශීය වතු සමාගම් වලින් ලැබෙන කල් බදු කුලී

2012 වර්ෂයට ලැබිය යුතු ආදායම් රු '000

| ආදායම් ශීර්ෂය | වාර්ෂික ආදායම් ඇස්තමේන්තුව | ප්‍රතිශෝධිත ආදායම් ඇස්තමේන්තුව | ලැබුන ආදායම | ආදායම ලැබීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 20.02.01.04 | 762,108 | 927,825 | 771,317 | 83% |

2012.12.31 දිනට හිඟ ආදායම් රු '000

| ආදායම් ශීර්ෂය | 2012.12.31 දිනට හිඟ ආදායම | 2012 වර්ෂය තුළ අයකර ගැනීම් | හිඟ ආදායම්අයකර ගැනීමේ ප්‍රතිශතය |
|---|---|---|---|
| 20.02.01.04 | 376,017 | 289,128 | 77% |

**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් "බී" ගිණුම**

රු '000

| | වියදමෙහි උපරිම සීමාව | ලැබීමේ අවම සීමාව | උපරිම හර ශේෂ සීමාව |
|---|---|---|---|
| විසර්ජන පනතින් බලය දෙනු ලැබූ සීමාවන් | 6,000 | 3,000 | 31,000 |
| වර්ෂය අවසානයේ තත්‍ය අගයන් | 4,498 | 3,066 | 16,603 |